(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 7(6).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2013 ජනවාරි මස 11 වැනි සිකුරාදා

## 2013 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 ඔක්තෝබර් 31 දිනැති අංක 1782/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.01.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

හඟුරන්කෙත මාදන්වෙල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2013 පෙබරවාරි මස 05 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1850/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී, එක් එක් වරායට අදාළව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශාලතම පිරිවැය ඉහළයාම් 10 සිදුවූයේ කවර කාර්යයන් සඳහාද;

(ii) ඉහත (i) හි සඳහන් පිරිවැය තීරණය කිරීමේදී සියලුම සාධක එක්ව සැලසීම මගින් ඇතිවූ ඒකාබද්ධ සමස්ත බලපෑම කවරේද;

(iii) පිරිවැය වැඩිවීමට සමානුපාතිකව ආදායමේ වැඩිවීමක් සිදුවී තිබේද;

(iv) නොඑසේ නම්, එම මූල්‍ය හිඟය පියවාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 6ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එක් සේවකයෙකු වෙනුවෙන් වූ අයහාරය, පිරිවැය, ලාභය සහ අගය එකතු කිරීම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1894/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන මාකඳුර නගර සංවර්ධන සැලසුම යටතේ හරිත නගරයක් හා හරිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළත්, මේ වනවිට එහි ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙහි ඉදිකිරීම් නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ඉදිකිරීම් සඳහා අරමුදල් සපයන ලද ආයතනය හෝ ආයතන කවරේද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හරිත නගරයේ හා හරිත ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් නැවත ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2139/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ මහතා අතුරුදන් වී ඇති දිනය කවරේද;

(ii) ඔහු මේ වන විට ජීවතුන් අතර සිටින්නේද;

(iii) වධහිංසාවලට එරෙහි ජාත්‍යන්තර කමිටුව හමුවේ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් පෙනී සිටි මොහාන් පීරිස් මහතා ප්‍රගීත් එක්නැලිගොඩ මහතා ජීවතුන් අතර සිටින බවට ප්‍රකාශ කර තිබේද;

(iv) එසේ ප්‍රකාශ කර තිබේ නම්, ඔහු සිටින රට හෝ ප්‍රදේශය පිළිබඳව සඳහන් කරන්නේද;

(v) ඔහු විදේශගතව සිටී නම්, මෙරටට ගෙන්වා ගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) උක්ත කමිටුව හමුවේ දී මොහාන් පීරිස් මහතා කළ ප්‍රකාශය සාවද්‍ය නම්, රටේ උත්තරීතර ආයතනයක උත්තරීතර නිලයක් දැරූ අයෙකු එසේ සාවද්‍ය තොරතුරු ජාත්‍යන්තරයට නිකුත් කර රටට සිදු කළ බලවත් අපකීර්තිය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2210/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන අනුව, අඩු ආදායම් නාගරික ජනාවාස ව්‍යාපෘතිය යටතේ නිවාස තැනීමට දෙන ලද පර්චස් දෙකක ඉඩම් කැබැල්ලේ පූර්ණ අයිතිය එහි වත්මන් පදිංචිකරුවන්ට ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන යටතේ මේ වන විට පර්චස් දෙකක පූර්ණ අයිතිය හිමිවූ පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2531/'12

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨවල සායනික පුහුණුව සඳහා වන මහාචාර්ය ඒකක (Professor Units) ඇති රෝහල් කවරේද;

(ii) එම එක් එක් මහාචාර්ය ඒකකය 2012 මාර්තු 31 දින වනවිට අනුයුක්තව සිටින මහාචාර්යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, පශ්චාත් උපාධිය හදාරන වෛද්‍යවරුන් (Senior Registrar සහ Registrar), ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් මහාචාර්ය ඒකකයේ කටයුතු සඳහා පවතින ශල්‍යාගාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජරට වෛද්‍ය පීඨයේ සායනික පුහුණුව සඳහා වන අනුරාධපුර මහ රෝහලේ මහාචාර්ය ඒකකය විවෘත කළ දිනය කවරේද;

(ii) දැනට එම මහාචාර්ය ඒකකයේ පුහුණුව ලබන වෛද්‍ය සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එහි පුහුණුව ලබන වෛද්‍ය සිසුන්ට ඉගැන්වීමට ප්‍රමාණවත් වෛද්‍යවරුන්, ශල්‍යාගාර, වාට්ටු සහ ඒවා පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය හා උපකරණ තිබේද;

(iv) නොඑසේ නම්, එම මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2548/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබී ඇති ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වනවිට පරීක්ෂණ අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

2849/'12

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නුවරඑළිය විවිධසේවා සමූපකාර සමිතියට අයත් දෙමහල් ගොඩනැගිල්ලක් බදුදීමට 2011 දෙසැම්බර් 19 දින පුවත්පත් දැන්වීමක් මගින් ටෙන්ඩර් කැඳවූයේද;

(ii) එසේ නම්, ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iii) පිළිගත් පටිපාටිය අනුව ටෙන්ඩර් කැඳවීමකදී සලකා බලන සහ ප්‍රමුඛතාවය ලබා දෙන කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ගොඩනැගිල්ල,

(i) ලබා ගැනීමට රුපියල් 320,000/- ක් සහ රුපියල් 355,000/- ලෙස මිල ගණන් ඉදිරිපත්ව තිබූ බවත්;

(ii) ටෙන්ඩර් අයදුම්පතක් හෝ ඉදිරිපත් නොකළ පුද්ගලයකුට මේ වන විට ලබා දී ඇති බවත්;

(iii) බදු දීමේදී අක්‍රමිකතාවයක් සිදු වී ඇති බවත්;

(iv) අක්‍රමිකව ලබාදීම නිසා අයදුම්කරුවන්ට අසාධාරණයක් මෙන්ම අදාළ සමූපකාර සමිතියට අලාභයක් සිදුව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහළම ටෙන්ඩරයට ගොඩනැගිල්ල ලබා නොදීමට හේතු කවරේද;

(ii) දැනට ගොඩනැගිල්ල ලබා දී ඇති අයගෙන් සමූපකාර සමිතිය ලබා ගන්නා මුදල කොපමණද;

(iii) ඉහත අක්‍රමිකතාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකොට ටෙන්ඩර්කරුවන්ට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා කොපමණ කාලයක් ගතවේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1895/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය අධ්‍යාපන කලාපයට අයත්ව තිබූ යාය ගාමිණී කණිෂ්ඨ විද්‍යාලය වසා දමා වර්ෂ ගණනාවක් ගතවී ඇති බවත්;

(ii) මෙම විද්‍යාලය සතුව පැවති ගොඩනැගිලි කිහිපයක් මේ වනවිට විනාශ වෙමින් පවතින බවත්;

(iii) එම විද්‍යාලය සතුව අක්කර හතක පමණ භූමි ප්‍රමාණයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යාය ගාමිණී කණිෂ්ඨ විද්‍යාලය සතු ගොඩනැගිලි සහ භූමිභාගය විනාශයට පත්වීමට ඉඩහැරීම ජාතික අපරාධයක් බවත්;

(ii) එම විද්‍යාලය සතු සම්පත් යොදා ගනිමින් කර්මාන්තශාලාවක් ආරම්භකර ප්‍රදේශයේ ජනතාවගේ රැකියා ප්‍රශ්නයට විසඳුම් සැපයිය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම පාසලේ සම්පත් මතු යෝජිත පරිදි යොදා ගැනීමට සැලසුම් කරන්නේද;

(ii) නොඑසේ නම්, වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1935/'11

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂයේ මැයි සිට ජූලි දක්වා වන කාල සීමාව තුළදී ශ්‍රී ලංකාවට බාල තත්ත්වයේ පෙට්‍රල් සහ වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදන සැපයූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම් කවරේද;

(ii) අමාත්‍යාංශය බාල තත්ත්වයේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේදී සිදුවී ඇති වංචාවලින් බැහැර වන්නේ කෙසේද;

(iii) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීම නිසා අලාභහානි විඳීමට සිදු වූ පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීමෙන් ඇති වූ අලාභ හානි සම්බන්ධව පැමිණිලි කළ පාරිභෝගිකයන්ගේ නම් කවරේද;

(v) අලාභ හානි විඳීමට සිදු වූ එක් එක් පාරිභෝගිකයාට වන්දි වශයෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(vi) තත්ත්වයෙන් බාල පෙට්‍රල් හේතුවෙන් හානි වූ යන්ත්‍රෝපකරණ සහිත ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(vii) එම ඉන්ධන පිරවුම්හල්වලට වන්දි ලබාදෙන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) තත්ත්වයෙන් බාල පෙට්‍රල් පිළිබඳ වංචාව ජනතාවට හෙළිකළ පාර්ශ්වයන් වෙත ආකර්ෂණීය ප්‍රසාද දීමනාවක් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2148/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයට 2005 වර්ෂයේ සිට මේ දක්වා කාලසීමාව තුළ බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට එහි පවතින සේවක අතිරික්තය හෝ සේවක ඌනතාවය කොපමණද;

(iv) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් බඳවාගෙන තිබේ නම්, එයට හේතු කවරේද;

(v) අතිරික්ත සේවකයින් බඳවා ගැනීමට අනුමතිය ලබා දුන් බලධරයාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2223/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, කොළඹ නගරයේ පැල්පත්වාසීන්ගේ නිවාස ගැටලුව විසඳීම සඳහා නිවාස ඒකක 40,000කින් සමන්විත මහල් නිවාස යෝජනා ක්‍රම 20ක් කොළඹ සහ තදාසන්න නගරවල ඉදිකිරීම පිණිස රුපියල් කෝටි 500ක ආරම්භක ප්‍රාග්ධනයක් ඉදිරි අයවැයෙන් වෙන්කරන බවට පොරොන්දුවක් දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පොරොන්දුව පරිදි රුපියල් කෝටි 500 ක් අයවැයෙන් වෙන් කළ වර්ෂය කුමක්ද;

(ii) එම මුදලින් මේ වනවිට ඉදිකිරීම් ආරම්භකර ඇති මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදිකිරීම් අවසන් මහල් නිවාස යෝජනා ක්‍රමවල මේ වන විට පදිංචිකර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1898/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කඩවාන වැව් බැම්ම කොටි ත්‍රස්තවාදීන් විසින් පුපුරවා හැර වර්ෂ විසි හයක් පමණ ගතවී ඇතත්, මේ දක්වා එය පිළිසකර නොකිරීම නිසා ගොවීන්ට වගා කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමට ඇති බාධාවන් කවරේද;

(ii) එම ගැටලු ඉවත්කර කඩිනමින් වැව අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2143/'11

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා මුදල් යෙදවීමට රජයට අරමුදල් ලබාදුන් පෞද්ගලික අංශයේ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) ඉහත කී ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට සහයෝගය ලබා ගැනීම සඳහා මෙරටට ගෙන්වා ගන්නා ලද පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට සහයෝගය ඉල්ලා සිටීම සඳහා විදේශ ගතවූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඒ වෙනුවෙන් දරන ලද මුළු පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2011 නොවැම්බර් මාසයේ සෙන්ට් කිට්ස් නගරයට ගිය පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ ගිය පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) එහි යාමට සහ ආපසු ඒමට දැරූ මුළු වියදම කොපමණද;

(iv) එම කණ්ඩායම සඳහා ලබාගත් කුලී ගුවන් යානා සඳහා දැරූ වියදම කොපමණද;

(v) ජයග්‍රහණය පිළිබඳ එපමණ විශ්වාසය තබා තිබියදී ශ්‍රී ලංකාවට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා සත්කාරක රට ලෙස කටයුතු කිරීමේ අවස්ථාව අහිමි වූයේ කෙසේද;

යන්නද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2149/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පැමිණීමේ හා ප්‍රවාහන දීමනා වශයෙන් වර්ෂ 2005 සිට මේ දක්වා ආයතන සේවකයින් වෙත ගෙවා ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෙවීම් සඳහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

(iv) භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

(v) එම ගෙවීම සඳහා අනුමතිය ලබා දුන් පුද්ගලයා හෝ පුද්ගලයින් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2224/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, “සැමට නිවසක් - හිතට සෙවණක්” වැඩපිළිවෙළ යටතේ, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර යන දිස්ත්‍රික්කවල විදේශ රැකියාවල යෙදෙන්නන් වෙනුවෙන්ම නිවාස 15000කින් සමන්විත නව නිවාස යෝජනා ක්‍රම තුනක් ආරම්භකරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති ආරම්භකළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන්කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් ව්‍යාපෘතිවල පදිංචිකර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 පෙබරවාරි මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1525/’11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දකුණු කොළඹ වරායේ වැඩ නිම කරනු ලබන දිනය කවරේද;

(ii) එම වරායේ වැඩ නිම වූ තත්ත්වය කරා එළඹීමට අවසන් කළ යුතු අදියර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දකුණු කොළඹ වරායේ දිය කඩනයේ ඉදිකිරීම් කටයුතු නිම කරනු ලබන දිනය කවරේද;

(ii) දියකඩනය ඉදිකිරීම සඳහා වන පිරිවැය කොපමණද;

(iii) දියකඩනය ඉදිකිරීම සඳහා වන පිරිවැය දරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත කී වරායේ නැංගුරම් ස්ථානවල ඉදිකිරීම් කටයුතු නිම කරනු ලබන දිනය කවරේද;

(ii) මුදල් යොදවා ඉහත කී නැංගුරම් ස්ථාන ඉදිකිරීමට පුද්ගලික අංශයේ සමාගම් ඉදිරිපත් වී තිබේද;

(iii) එසේ නම්, එකී සමාගම්වල නම් සහ ඔවුන්ට ලබා දෙන පහසුකම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1819/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දිවුලපැලැස්ස මහවැලි ගම්මානයේ ඉදිකරන ලද පානීය ජල ව්‍යාපෘතිය ජලය නොමැති හේතුවෙන් අත්හැර දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල යෝජනා ක්‍රමය සඳහා වැයකරන ලද මුදල කොපමණද;

(ii) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ජලය ලබාගැනීමේ ශක්‍යතාවය පිළිබඳව අධ්‍යයනයක් කරනු ලැබුවේද;

(iii) එම ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ ප්‍රතිඵලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දිවුලපැලැස්ස මහවැලි ගම්මානයේ ජල ව්‍යාපෘතිය ඉදිකිරීමේදී අයථා මුදල් පරිහරණයක් සිදු වී ඇති බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඉහත ජල ව්‍යාපෘතිය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2068/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා කොටස් වෙළඳපොලේ ආයෝජනය කර ඇති රජයේ ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනය විසින් මිලදී ගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ආයතනය අයෝජනය කරන අවස්ථාවේ දී කොටසක වටිනාකම කොපමණද;

(iv) වර්තමානයේ එම එක් එක් කොටසේ වටිනාකම කොපමණද;

(v) කොටස්වල අයෝජනය කිරීමෙන් එම ආයතන ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2230/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 - 2010 අතර කාල වකවානුව තුළ රට තුළ වසා දැමූ රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) පාසල් වසාදැමීමට ප්‍රධානතම හේතුව ප්‍රමාණවත් සම්පත් නොලැබීම බව පිළිගන්නේද;

(iii) නොඑසේ නම්, එම පාසල් වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2532/'12

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 - 2011 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ එක් එක් විශ්වවිද්‍යාලයේ විදේශීය සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිශතය 5% දක්වා වැඩිකර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිශතය අනුව ඉහත අධ්‍යයන වර්ෂයේ එක් එක් පීඨය සඳහා විදේශීය සිසුන් වෙනුවෙන් වෙන්කරන ලද අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට එම එක් එක් පීඨයට ඇතුළත්වී ඇති විදේශීය සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ අනුව දැනට එම එක් එක් පීඨයේ විදේශීය සිසුන් සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 – 2011 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ විදේශීය සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2549/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පැලියගොඩ මාළු වෙළඳපොළ තුළ කප්පම් ගැනීමේ සිදුවීම් පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය වෙත පැමිණිලි ලැබී තිබේද;

(ii) එම පැමිණිලි පිළිබඳව කරන ලද පරීක්ෂණ අනුව මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම පැමිණිලිවලට අදාළව අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ අත්අඩංගුවට ගත් අයගේ නාමලේඛනයක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2851/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2000 අංක 9 දරන වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ, "වැඩිහිටි හැඳුනුම්පත්" නිකුත් කරනු ලබන්නේද;

(ii) එම හැඳුනුම්පත පිටුපස සෞඛ්‍ය සේවා, බැංකු සේවා, පොලිස් සහ නීති උපදෙස්, තැපැල් හා විශ්‍රාම වැටුප් සහ කාර්යාල කටයුතු යන සේවාවන්වලදී හැඳුනුම්පත්ලාභියාට ප්‍රමුඛතාවයක් ලැබිය යුතු බව සඳහන් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත කී ප්‍රමුඛතාවය ලබා දීම සඳහා,

(i) රජය විසින් සකස් කොට ඇති නීති හා පනවා ඇති රෙගුලාසි කවරේද;

(ii) එම නීති සහ රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අවම වශයෙන් රජයේ රෝහලක වෛද්‍යවරුන් මුණ ගැසීම, සායනයන්ට සහභාගී වීම සහ බෙහෙත් ලබාගැනීම යන කටයුතුවලදී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ප්‍රමුඛතාව ලබාදීම සඳහා නීතිමය බලය ලැබෙන චක්‍රලේඛයක් සහ / හෝ රෙගුලාසියක් හැකි ඉක්මනින් නිකුත් කිරීමට පියවර ගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1531/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) රැකියා සඳහා විදේශ රටවලට ගිය තැනැත්තන් විසින් විදේශ රැකියා නියුක්ති කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) රැකියා සඳහා විදේශ රටවලට ගිය තැනැත්තන්ට රක්ෂණ ආවරණය ලබාදීම මගින් රජය විසින් උපයා ගත් ආදායම කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රැකියා සඳහා විදේශ රටවලට යන සේවකයින් හට රක්ෂණ ඔප්පු ලබා දීමට සුදුසුකම් ලබා ඇති රක්ෂණ සමාගම් කවරේද;

(ii) එම සමාගම් තෝරා ගනු ලබන්නේ නිසි ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීම මගින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1821/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවත් මහනුවර නගරයත් යා කෙරෙන හල්ඔළුව, දොඩම්වල සංගිලි පාලම වෙනුවට ස්ථිර පාලමක් ඉදිකිරීම සඳහා කීපවරක් මුල්ගල් තබා ඇතත් මේ දක්වා එම පාලම ඉදිවී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනතාවගේ ගමන් පහසුව සඳහා ඉහත ස්ථානයේ නව පාලමක් ඉදි කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එලෙස වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) එම පාලම ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2069/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009 වර්ෂයේ සිට මේ දක්වා කොළඹ කොටස් වෙළඳපලෙහි මුදල් ආයෝජනය කළ,

(i) විදේශ සමාගම්වල නම් සහ එක් එක් සමාගම විසින් අයෝජනය කළ මුදල කොපමණද;

(ii) එම ආයෝජනයන්ගෙන් මේ වන විට තම ආයෝජන ඉවත් කර ගෙන ඇති සමාගම් කවරේද;

(iii) එම ආයෝජනයන් ඉවත් කර ගත් දින කවරේද;

(iv) එම ආයෝජන ඉවත් කර ගැනීමට හේතු දක්වා තිබේද;

(v) එසේ නම්, එම හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2256/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතේ රැකියා වියුක්තියේ ප්‍රතිශතය කොපමණද;

(ii) එම පළාතේ විරැකියාව අවම කිරීම උදෙසා ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවරයන් දින වකවානු ඉලක්ක සහිතව සපුරාලන්නට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1544/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ශ්‍රී ලංකාවට ලිමොසින් නමැති අධි සුඛෝපභෝගී වාහන වර්ගය ආනයනය කිරීම සඳහා අවසරදීමට හේතු කවරේද;

(ii) මේ දක්වා ආනයනය කර ඇති ලිමොසින් වර්ගයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ආනයනය කරන ලද ලිමොසින් වර්ගයේ වාහනයක වටිනාකම කොපමණද;

(iv) ලිමොසින් වර්ගයේ වාහනයක් නිෂ්කාශණය කිරීම සඳහා ගෙවන ලද තීරු බදු සහ අනෙකුත් බදු ප්‍රමාණය කවරේද;

(v) එකී වාහන නිෂ්කාශණය කරගත් අයගේ නම් සහ ඒවා නිෂ්කාශණය කරගත් දිනයන් කවරේද;

(vi) ඉහත කී වාහනය සුඛෝපභෝගී වාහනයක් ලෙසින් වර්ගීකරණය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එන්ජින් ධාරිතාව 1000CC ට වඩා අඩු සහ 1000CC - 2000CC අතර ත්‍රිරෝද රථ සහ අනෙකුත් වාහනවලට අදාළ ආනයන බදු ප්‍රමාණය කවරේද;

(ii) අනෙකුත් සුඛෝපභෝගී වාහනවලට ආනයනයේදී අදාළවන තීරු බදු ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (ආ) (ii) හි සඳහන් වාහනවලට අදාළ තීරු බදු අයි සුඛෝපභෝගී ලිමොසින් වර්ගයේ වාහන සඳහාද අය කළ යුතුව තිබුනේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1822/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) විශාල ජන සංඛ්‍යාවක් සේවය ලබන හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මුල්ගිරිගල, වලස්මුල්ල, යහල්මුල්ල පවුල් සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල මේ වනවිට කඩා වැටීමේ අවදානමකට ලක්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එම මුදල කොපමණද;

(iv) එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2121/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාවේදී මාර්ග සංවර්ධන අධිකාරියට කුලී පදනම මත වාහන ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ලබා ගත් වාහන කවරේද;

(iii) එම වාහන කවර කාර්යයන් සඳහා යොදා ගන්නේද;

(iv) එම කුලී වාහන සැපයූ ආයතනවල නම්, ලිපිනයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) ඉහත වාහන ලබාගත් වර්ෂයන් කවරේද;

(vi) මේ වන විට එම වාහන නිදහස් කර තිබේ නම්, එම නිදහස් කළ වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2257/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ රැකියා වියුක්තියේ ප්‍රතිශතය කොපමණද;

(ii) එම පළාතේ විරැකියාව අවම කිරීම උදෙසා ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවරයන් දින වකවානු ඉලක්ක සහිතව සපුරාලන්නට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 පෙබරවාරි මස 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1747/'11

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැසිනෝ ව්‍යාපාර සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් ලෙස මෙම රජය පිළිගන්නේද;

(ii) නොඑසේ නම්, කැසිනෝ ව්‍යාපාරයට අදාළ කටයුතු නීතිගත කිරීමට සහ ඒවායින් බදු අය කිරීමට හේතු කවරේද;

(iii) කැසිනෝ ව්‍යාපාරය තුළින් රටට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1893/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කැකණදුර, ඇල්ලකන්ද වැවේ වැව් බැම්මෙහි ස්ථාන කිහිපයකින්ම ජලය කාන්දුවීමට පටන් ගැනීම නිසා අවට ගම්මානවල පදිංචිකරුවන් ගැටලු රැසකට මුහුණපා ඇති බවත්;

(ii) වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී අදාළ නිලධාරීන් විසින් සිදුකරන ලද අක්‍රමිකතා නිසා එම තත්ත්වය ඇති වී තිබෙන බවට ගොවීන් චෝදනා කරන බවත්;

(iii) ප්‍රදේශයේ ජනතාව විසින් ඉහත තත්ත්වයන් පිළිබඳව අදාළ බලධාරීන්ට දැනුම් දී ඇතත් මේ දක්වා ඊට විසඳුමක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කැකණදුර, ඇල්ලකන්ද වැවේ ප්‍රතිසංස්කරණ කටයුතුවලදී සිදු වී ඇති අක්‍රමිකතාවන් පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදුකරන්නේද;

(ii) වැව නැවත ප්‍රතිසංස්කරණයකර ජලය කාන්දුවීම් නැවැත්වීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2270/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ නත්තල් දින හෝ ඊට ආසන්න දිනක තංගල්ල ප්‍රදේශයේ නිවාඩු නිකේතනයක විදේශිකයෙකු ඝාතනය කිරීමක් සිදුවූයේද;

(ii) එසේ නම්, ඝාතනයට ලක්වූ පුද්ගලයාගේ නම සහ රට කවරේද;

(iii) එම ඝාතනයට හේතු කවරේද;

(iv) එම ඝාතනයේ සැකකරුවන් හඳුනාගෙන තිබේද;

(v) ඔවුන් දරන තනතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ඝාතනය සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

(ii) එම ඝාතනය හේතුවෙන් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් මුහුණදීමට සිදුවී ඇති තත්ත්වයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2331/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මධ්‍යම රජයේ හා පළාත් සභා යටතේ පාලනය වන පාසල්වල බුද්ධ ධර්මය විෂයය ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බුද්ධ ධර්මය විෂයය ඉගැන්වීමට බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් අය ගුරු සේවයට බඳවා ගැනීමට අදාළව අංක අමප/10/2376/436/052 යටතේ 2010 ඔක්තෝබර් 28 දින කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේද;

(ii) දැනට බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත්ව ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ ගුරුභවතුන් බඳවා ගන්නා ක්‍රියාපටිපාටියට අනුකූලව බුද්ධ ධර්මය විෂයය ඉගැන්වීම සඳහා බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් අය බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම බඳවා ගැනීම් කොපමණ කාලයක් තුළ සිදු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2524/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 වර්ෂය තුළදී පළමු වසරට පාසල් සිසුන් ඇතුළත් කරගැනීම, පෙළපොත් බෙදාදීම, නිල ඇඳුම් බෙදාදීම, 5 වසර ශිෂ්‍යත්වය සමත් වූ දරුවන්ට සහතික බෙදාදීම හා සපිරි පාසල් ව්‍යාපෘතිය ආරම්භ කිරීම යන කටයුතුවලට අදාළ එක් එක් ජාතික උත්සවය,

(i) පැවැත්වූ දිනය කවරේද;

(ii) පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) පැවැත්වීමට වැය කළ මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් සියලු ජාතික උත්සව පැවැත්වීමට වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2546/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද හමුදාවට, ගුවන් හමුදාවට සහ නාවික හමුදාවට ආහාර සැපයීම සිදුකරනු ලබන පුද්ගලයන් හා ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පුද්ගලයන් හා ආයතන තෝරා ගැනීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද පුද්ගලයන් හා ආයතන කවරේද;

(iv) එම එක් එක් පුද්ගලයා හෝ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

(v) තෝරාගනු ලැබූ පුද්ගලයන් හා ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2831/'12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැන්දඹු කාන්තාවන්ට ආර්ථික වශයෙන් ස්ථාවරභාවයක් ලඟාකරදීමට සහය වනු පිණිස, රජය විසින් කිසියම් ප්‍රතිපත්තීන් සමූහයක් ක්‍රියාත්මක කරමින් තිබෙන්නේද;

(ii) එසේ නම්, එලෙස ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තීන් කවරේද;

(iii) එම කාන්තාවන්ට නැවත සමාජගතවීමට සහය වනු පිණිස අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන සැලසුම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1756/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හමුදාමය නොවන කටයුතු පවරා ඇති ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් විසින් ඉටු කළ යුතු හමුදාමය නොවන කටයුතුවල ස්වභාවය කවරේද;

(iii) ඔවුන්ට හමුදාමය නොවන කටයුතු ඉටුකිරීම වෙනුවෙන් අමතර ගෙවීමක් කරනු ලැබේද;

(iv) එසේ නම්, ඉහත (iii) හි සඳහන් පරිදි ගෙවනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ත්‍රිවිධ හමුදාවල සාමාජිකයින් කිසිවෙකු ඔවුන්ට පවරනු ලබන හමුදාමය නොවන කටයුතු කිරීමට නොහැකිවීම හේතුවෙන් ඉල්ලා අස්වී තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1899/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්ව තිබූ, ඉඹුල්පිටිය, ගා/ රාමදොල කණිෂ්ඨ විද්‍යාලයය මීට වර්ෂ කිහිපයකට පෙර වැසීයාම නිසා ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සම්පත් විනාශවෙමින් පවතින බවත්;

(ii) මේ වනවිට එම පාසල් භූමිය අසල්වාසීන් විසින් අත්පත්කර ගැනීමේ අවදානමක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බලහත්කාරයෙන් පාසල් භූමිය අත්පත් කරගැනීම නවතාලීමට කටයුතු කරන්නේද;

(ii) ගා/ රාමදොල කණිෂ්ඨ විද්‍යාලයය සතු භූමිය සහ ගොඩනැගිලි වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම කුමක්ද;

(iv) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2271/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ නත්තල් දින හෝ ඊට ආසන්න දිනක තංගල්ල ප්‍රදේශයේ නිවාඩු නිකේතනයකදී විදේශිකයෙකු ඝාතනය කිරීමක් සිදුව ඇත්නම්, එසේ ඝාතනය වූ පුද්ගලයා සමඟ සිටි අනෙකුත් විදේශීය පුද්ගලයාගේ නම කවරේද;

(ii) ඔහුගේ හෝ ඇයගේ රට කුමක්ද;

(iii) එම පුද්ගලයා කාන්තාවක් නම්, ඇය දූෂණයකර හෝ අතවරයකට ලක්කර තිබේද;

(iv) මේ වනවිට ඔහු හෝ ඇය ජීවත්ව සිටින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සිදුවීම හේතුවෙන් ශ්‍රී ලංකාවට අත් වූ අපකීර්තිය මකාලීම සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2333/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2004 හා 2006 වර්ෂවලදී රාජ්‍ය සේවකයින්ට ලබාදුන් වැටුප් පරිවර්තනයන්ට සමගාමීව 2006.01.01 දිනට පෙර විශ්‍රාම ගිය රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමටත් ;

(ii) වැටුප් විෂමතාවයන් ඉවත් කිරීම සලකා බැලීම සඳහා අවස්ථා කිහිපයකදී පත්කරන ලද කමිටු වාර්තාවල සඳහන් නිර්දේශ සලකා එම විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේදී දීමනා ලබාදීම වෙනුවට වැඩිවන අගයන් ඒකාබද්ධ වැටුපට එකතු කිරීමටත්;

එතුමා කටයුතු කරන්නෙහිද?

(ආ) (i) 2004 හා 2006 යන වර්ෂවලදී විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුපට 2012 අයවැය ලේඛනයෙන් ප්‍රමාණවත් දීමනාවක් එක් කර තිබේද;

(ii) රාජ්‍ය සේවකයින්ට යම්කිසි වැටුප් පරිවර්තනයක් සිදුකරන්නේ නම්, එයට සමගාමීව සියලුම විශ්‍රාමිකයින්ට එම වැඩිවීම ලබාදීමේ ජාතික ප්‍රතිපත්තියක් පාර්ලිමේන්තු පනතකින් සම්මත කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1757/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යුද හමුදාව සමග දැනට ව්‍යාපාර කටයුතු කරමින් සිටින හිටපු යුධ හමුදා නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ කිරීම සඳහා අවසර දිය හැකිද;

(iii) යුද හමුදාව සමග වැඩිපුරම වෙළඳ කටයුතු කරන සමාගම් 20 හි නම් සහ ඒවායෙහි අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ සඳහා එම එක් එක් සමාගමේ වෙළඳ වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත සඳහන් සමාගම් යුද හමුදාව සමග ව්‍යාපාර කටයුතු කිරීමේ අවස්ථාව ලබා ගැනීමේදී ටෙන්ඩර් පටිපාටීන් අනුගමනය කරන්නේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1938/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාතේ දුෂ්කර පාසල්වල වර්ෂ ගණනාවක් ස්වේච්ඡාවෙන් සේවය කරන ලද ගුරුවරුන් 780 ක් 2007 වර්ෂයේ දී ගුරු සහායකයින් ලෙස බඳවා ගනු ලැබූ බවත්;

(ii) බඳවා ගැනීමෙන් පසු මේ දක්වා එම එක් ගුරු සහායකයෙකුට මාසිකව ගෙවනු ලබන්නේ රුපියල් තුන්දහසක දීමනාවක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගුරු සහායකයින්ට දැනට ගෙවනු ලබන දීමනාව වැඩිකර, ඔවුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2273/’12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය පවත්වන ලද දිනය කවරේද;

(ii) එකී විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන ලද දිනය කවරේද;

(iii) නිකුත් කරන ලද ප්‍රතිඵල අවලංගු කර නැවත ප්‍රතිඵල නිකුත් කිරීමක් සිදු කළේද;

(iv) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇතිවූ අවුල් සහගත තත්ත්වය පිළිබඳ වගකිවයුත්තෝ කවුරුන්ද;

(ii) ඔවුන් සම්බන්ධයෙන් ගැනීමට නියමිත හෝ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ප්‍රතිඵල සංශෝධනය හේතුවෙන් බලාපොරොත්තු කඩවී අපහසුතාවයට පත්වූ පාර්ශ්වයන් සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

(iv) ඉදිරියේදී විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් අවුල් සහගත තත්ත්වයන් ඇති නොවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2335/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) “මහින්ද චින්තන - ඉදිරි දැක්ම” ප්‍රතිපත්ති මාලාව යටතේ හෙද සේවය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට එම ජාතික ප්‍රතිපත්තිය සකස් කර අවසන්ව තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1944/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන මාර/දෙයියන්දර ප්‍රාථමික විද්‍යාලය දැනට පිහිටා ඇති ස්ථානයෙන් වෙනත් ප්‍රදේශයකට රැගෙන යෑමේ සූදානමක් තිබේද;

(ii) එසේ නම්, එම පාසල නැවත ස්ථාපනය කරන ස්ථානය කවරේද;

(iii) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

(iv) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(v) එසේ නම්, නව පාසලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2183/'11

ගරු රවී කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ඉඩම් හිමිකම් අංශය විසින් දැනට පවතින හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති දුර්වලතා රාශියක් සොයාගෙන ඇති බවත්;

(ii) ඉහත කී පනත සංශෝධනය කළ යුතු බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් ද නිර්දේශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ) (i) සහ (ii) අනුව හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති දුර්වලතා සහ යෝජිත සංශෝධන කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) පාර්ලිමේන්තුව මගින් එම සංශෝධන සඳහා මේ වනවිට අනුගමනය කරමින් පවතින ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) දුර්වලතා රාශියක් පැවතියද, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත දැඩිව ක්‍රියාත්මක කරමින් සිටින බවත්;

(ii) අදාළ අමාත්‍යාංශය විසින්, එම හඳුනාගත් දුර්වලතා වෙනස් නොකර, ඉහත කී පනතට නව වගන්ති 105ක් ඇතුළු කිරීමට උත්සාහ දරමින් සිටින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2277/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සිටින කිසිදු ආදායමකට හිමිකම් නොකියන, ආබාධිත පුද්ගලයින් හා වයෝවෘද්ධ පුද්ගලයින් සහිත පවුල් සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණද;

(ii) 2005 මහින්ද චින්තන ප්‍රකාශනයේ සඳහන් "කිසිදු ආදායමකට හිමිකමක් නොලබන ආබාධ සහිත පුද්ගලයන් සිටින පවුලක් සඳහා මසකට රුපියල් 3,000 ක් ලබා දෙන්නෙමි." යන පොරොන්දුව පරිදි මේ වනවිට එම මුදල ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම ප්‍රතිලාභය ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම මුදල් ලබාදීම වෙනුවෙන් වාර්ෂිකව වැයකරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ)(ii) හි සඳහන් පොරොන්දුව මේ වනවිට ක්‍රියාත්මක නොවන්නේ නම්, ඊට හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2336/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව යටතේ පිළිකා වැනි බෝනොවන රෝග මුළුමනින්ම පාලනය කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමට හා ඊට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමට ස්වාධීන විද්වතුන්ගෙන් සමන්විත කාර්ය සාධක බලකායක් පත්කිරීමටත්, මාස හයක් තුළ අදාළ කටයුත්ත නිමකිරීමටත් පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කාර්ය සාධක බලකායට ඇතුළත් වූ විද්වතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එමගින් ඉදිරිපත් කරන ලද නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2536/'12

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වර්ෂයේ දී,

(i) මහපොල ශිෂ්‍යත්ව අරමුදල් ලබාගෙන ඇති විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විශ්වවිද්‍යාල සිසුන්ට මහපොල ශිෂ්‍යත්ව ලබාදීමට වැය කර ඇති මුළු මුදල කොපමණද;

(iii) මහපොල ශිෂ්‍යත්ව වාරික ගෙවීම වෙනුවෙන් එක් එක් විශ්වවිද්‍යාලය සඳහා වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල සිසුන්ගේ මහපොල ශිෂ්‍යත්ව වාරිකය අවසන්වරට වැඩි කළ වර්ෂය කවරේද;

(ii) එම අවස්ථාවේදී වාරිකය වැඩි කළ මුදල කොපමණද;

(iii) වත්මන් මහපොල ශිෂ්‍යත්ව වාරික මුදල වැඩිකිරීමට පියවර ගනු ලබන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2830/'12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රෝහල් සඳහා ශල්‍ය අත්වැසුම් සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා යොදාගන්නා ක්‍රියාවලිය කවරේද;

(ii) ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සම්බන්ධයෙන් තීරණ ගන්නා පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) සැපයුම් දිනය, සැපයුම් කාල සීමාව සහ එකඟ වී ඇති කාල පරිච්ඡේදය තුළ සැපයුම් කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් සැපයුම් කොන්ත්‍රාත්තුවෙහි දක්වා ඇති සම්මත වගන්ති කවරේද;

(iv) 2008, 2009, 2010 හා 2011 යන වර්ෂවලදී ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සඳහා වෙන්කර තිබූ මුදල සහ වියදම්කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මූලික පරීක්ෂණයකදී ශලා්‍ය අත්වැසුම් මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ වංචාවක් හෙළිදරව් වී ඇති බවත්;

(ii) වැඩිදුර පරීක්ෂණ සඳහා මෙම වංචාව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එකී වංචාවේ ස්වභාවය කවරේද;

(ii) එකී වංචාව හේතුවෙන් සිදුවී ඇති මූල්‍යමය පාඩුව කොපමණද;

(iii) ඉහත (ආ) (ii) හි සඳහන් පරිදි එය සිදු කළේ නම්, එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2883/'12

ගරු මනූෂ නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2012 වර්ෂයේ දී ගාල්ල අධ්‍යාපන කලාපයේ පිහිටි ජාතික පාසල්වල,

(i) පළමුවැනි ශ්‍රේණියේ සිට දහතුන්වැනි ශ්‍රේණිය දක්වා පන්තිවල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව එක් එක් පන්තිය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පළමුවැනි ශ්‍රේණියට සම්මුඛ පරීක්ෂණයෙන් සමත් සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කොට තිබේද;

(iii) පළමුවැනි ශ්‍රේණියට එසේ ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

(iv) පළමුවැනි ශ්‍රේණියට හැර අනෙකුත් ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කර තිබේද;

(v) අනෙකුත් ශ්‍රේණි සඳහා ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල් සඳහා සම්මුඛ පරීක්ෂණයන්ගෙන් සමත් වන සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කිරීම සඳහා බලය පැවරූ නීත්‍යානුකූල ලිපි ලේඛන තිබේද;

(ii) එකී ලිපි ලේඛන මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1949/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට අයත් නක්කල සතිපොළ මීට වර්ෂයකට පමණ පෙර විවෘත කළ බවත්;

(ii) විවිධ පුද්ගලයන්ගේ බලපෑම් නිසා මේ වන විට වෙළෙඳුන්ට එහි පැමිණ වෙළඳාම් කිරීමට නොහැකිවී ඇති බවත්;

(iii) ඒ නිසාම සතිපොළ පාළුවට ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නක්කල සතිපොළෙහි පවත්නා මෙම තත්ත්වය මඟහරවා වෙළෙඳුන්ට නිදහසේ වෙළෙඳාම් කිරීමටත් ඔවුන්ට ආරක්ෂාව සම්බන්ධයෙන් පවත්නා ගැටලු විසඳාදීමටත් කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2278/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත කළුගඟ ව්‍යාපාරය ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එම යෝජනා ක්‍රමය ආරම්භ කිරීමට හේතු කවරේද;

(iii) එම වාරි ව්‍යාපාරයට යටවන මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එම භූමිය තුළ ඇති කෘෂිකාර්මික වැදගත්කමක් ඇති ඉඩම් ප්‍රමාණය සහ වගා කර ඇති කෘෂිකාර්මික වගාවන් කවරේද;

(v) එයට යට වන ගම්මාන කවරේද;

(vi) එම ව්‍යාපාරය නිසා අවතැන්වන පවුල් සංඛ්‍යාව සහ ජනගහනය කොපමණද;

(vii) ඒ යටතේ ඉවත් කිරීමට සිදුවන රජයේ ආයතන, පෞද්ගලික ආයතන, විහාරස්ථාන සහ අනෙකුත් වැදගත් ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලබාගත් පරිසර ශක්‍යතා වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(ii) එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අවතැන්වන ජනතාව සහ ඔවුන්ට අහිමිවන වත්කම් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) ආර්ථිකමය වශයෙන් ඉතා ඉහළ අගයක් ඇති ඉඩම් අහිමිවන හෙයින් සහ විශාල ජනතාවක් අවතැන්වන හෙයින් මෙම යෝජනා ක්‍රමය නවතා දැමීමට හෝ හානි අවම ස්ථානයක් වෙත ගෙන යාමට හෝ කටයුතු යොදන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2319/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අදහනු ලබන ආගම් කවරේද;

(ii) බුද්ධ ධර්මය, හින්දු ධර්මය, කතෝලික ධර්මය සහ ඉස්ලාම් ධර්මය යනාදී ශ්‍රී ලංකාවේ අදහනු ලබන එක් එක් ආගමට අදාළ පැරණිතම සිද්ධස්ථාන තුන කවරේද;

(iii) එම සිද්ධස්ථාන ඉදිකරනු ලැබූ කාල වකවානු සහ ඒවා පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කී සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජය විසින් යොදවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම උදෙසා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2338/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) “මහින්ද චින්තන - ඉදිරි දැක්ම” ප්‍රතිපත්ති මාලාව මගින් කොළඹට පමණක් සීමා වී ඇති විශේෂඥ රෝහල් දෙක බැගින් සෑම පළාතකම ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ වන විට එම රෝහල් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1963/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි, උග්ගල්බැවුල, උඩපීක්වැල්ල වර්ෂ 200ක් පමණ පැරණි ගංගාතිලක පුරාණ විහාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කිරීම සඳහා නම් කරන ලද සිද්ධස්ථානයක් බවත්;

(ii) එහි සියලු ගොඩනැගිලි සහ විහාර බිතු සිතුවම් විනාශවෙමින් පවතින බවත්;

(iii) මෙම විහාරස්ථානය පිහිටා ඇති භූමියද නායයාමේ තර්ජනයකට මුහුණපා ඇති බවත්;

(iv) එම නිසා විහාරස්ථානය පාමුලින් වැටී ඇති මාතර-වැල්ලවාය මාර්ගයේ ගමන් ගන්නා ජනතාවගේ ජීවිතවලට තර්ජනයක් ඇතිවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උග්ගල්බැවුල, උඩපීක්වැල්ල ගංගාතිලක විහාරස්ථානයේ බිතු සිතුවම් සහ එහි භූමිය සංරක්ෂණය කිරීම සඳහා සැලසුම් කර තිබේද;

(ii) මේ වන විට ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) මුදල් වෙන්කර තිබේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2279/’12

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන ආයතන මගින් පාලනය වන දිවයින පුරා පිහිටි පුස්තකාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුස්තකාලවල පුස්තකාල සහකාර තනතුරේ සේවය කරන සේවක සේවිකා සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට ලබා දෙන මාසික වැටුප හෝ දීමනාව කොපමණද;

(iv) පළපුරුද්ද හා සේවා කාලය අනුව රජයේ සේවකයින්ට හිමි උසස්වීම් ලැබීමේ අවස්ථාව සහ විශ්‍රාම වැටුප් හිමිකම පුස්තකාල සහකාර තනතුරට හිමිවී තිබේද;

(v) එම උසස්වීම් අවස්ථා නොතිබේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පළපුරුද්ද හා සේවා කාලය අනුව රාජ්‍ය සේවයේ බහුතරයකට හිමි උසස්වීම් ලැබීමේ අවස්ථාව පුස්තකාල සහායකයින්ට හිමි නොවීම බලවත් අසාධාරණයක් සහ මානව හිමිකම් කඩවීමක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට එම අයිතිවාසිකම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2340/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ කාන්තා රෝග නිවාරණය පිළිබඳ වෙනම අංශයක් ආරම්භ කිරීමට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට එම අංශය විවෘතව පවතින්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2463/'12

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011 සහ 2012 යන වර්ෂයන්හිදී, "උතුරු වසන්තය" සහ "නැගෙනහිර උදානය" වැඩසටහන්වලට අදාළව,

(i) දැරීමට සිදුවූ වියදම සහ ඒවායින් ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(ii) ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) මුදල් ප්‍රවාහයන් මඟින් සත්‍ය වශයෙන් වැයකළ මුදල් ප්‍රමාණය ලෙස තහවුරු වූ නිශ්චිත වියදම කොපමණද;

යන්න එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) "උතුරු වසන්තය" සහ "නැගෙනහිර උදානය" වෙනුවෙන් 2010, 2011 සහ 2012 වර්ෂයන් සඳහා ලැබුණු මුළු ආධාර මුදල් සහ ප්‍රදානයන් ප්‍රමාණය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 12/'10

ගරු රවි කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

ගරු රවි කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

ගරු රවි කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා "තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

ගරු රවි කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට ඍජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවි කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ

උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදිකිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල

අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/’10

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/’10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/’10

ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/’10

ගරු රවී කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායී කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා

නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදී සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපලට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම,— අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය,

ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි හව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම

ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන

මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/’10

ගරු බුද්ධික පතිරණ මහතා, —නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම, — පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස්

ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම

සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'11

ගරු රුවන් රණතුංග මහතා,— උපාධිධාරී ග්‍රාම නිලධාරීන් අගැයීම සඳහා දීමනාවක් ලබා දීම,— රාජ්‍ය සේවය ගම් මට්ටමින් ජනතාවට ලබා දීම සඳහා සේවය කරන ග්‍රාම නිලධාරීන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් පසුව තරහ විභාග ලකුණු මත බඳවා ගෙන ඇතත්, දැනට සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරීන් අතරින් 30 % ක් 40 % ක් පමණ පිරිසක් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එයට කිසිදු සැලකිල්ලක් මෙතෙක් දක්වා නැති බැවින් උපාධි සුදුසුකම අගැයීම සඳහා උපාධිධාරී ග්‍රාම නිලධාරීන්ට වැටුප් වැඩිවීමක් හෝ දීමනාවක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම

පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

ගරු රවී කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/'11

ගරු අජිත් කුමාර මහතා,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ස්ථාන පිළිබඳ නිබන්ධනයක් සකස් කිරීම,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික, පුරා විද්‍යාත්මක හා සංස්කෘතිකමය වශයෙන් වටිනා ස්ථාන සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදුකර ඒ පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් වටිනාකමක් ඇති නිබන්ධනයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'11

ගරු රවී කරුණානායක මහතා,— මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— මැතිවරණ ක්‍රියා පටිපාටිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ස්ථිර පදනමකින් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'11

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් කඩිනමින් මුදල් ගෙවීම,— සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය දරන සියලුම සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් ක්‍රියාකාරී සේවයෙන් විශ්‍රාම ගෙන එක් මසක් ගතවීමෙන් අනතුරුව ගෙවීම සඳහා විධිවිධාන සැළසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'11

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය මාධ්‍යවල අපක්ෂපාතීත්වය තහවුරු කිරීම,— රාජ්‍ය මාධ්‍ය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක්ම හිමි වූ තනි අයිතිවාසිකමක්වන නිසාත්, රජයේ මාධ්‍ය නිරන්තරවම දේශපාලනීකරණයට ලක්වීමක් සිදුවී තිබෙන නිසාත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී සිටින සියලුම දේශපාලන පක්ෂවලට රාජ්‍ය මාධ්‍ය තුළින් සමාන ලෙස සැලකීම සහ සමාන ලෙස අවස්ථාවන් ලබාදීම තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'11

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සේවයේ භාෂා ප්‍රවීණත්වයේ අවශ්‍යතාව,— වර්ෂ 2025 වන විට සියලුම රජයේ සේවකයන්ට සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වැඩ කටයුතු කිරීමට, ලිපි හුවමාරු කර ගැනීමට සහ කථා කිරීමට හැකි වීම රජය විසින් අනිවාර්ය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කරදීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා වෙත, දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% කට සමාන වූ විමධ්‍යගත අයවැය මුදලක් වාර්ෂිකව වෙන්කළ යුතු බවත් එම වෙන්කිරීමෙන්, 50% ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් උපයෝගීකර ගැනීමටත් ශේෂය රජයේ නිර්ණායක මත පදනම්ව තම ඡන්ද දායකයින් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි කවර හෝ පදනමකින් උපයෝගී කර ගැනීම සඳහාත් හිමිකම් ලබා දිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පොල් කර්මාන්තයෙහි සහ පොල් සම්පත්වල සංවර්ධනය හා ප්‍රවර්ධනය විධිමත් කිරීම,— වානිජමය නිෂ්පාදන අතර ඉතා වැදගත් ස්ථානයක් පොල්වලට හිමි වන හෙයින් පොල් සම්පත් සහ ඒවායේ පරිසරය තිරසාරව පවත්වා ගන්නා අතරම දළ දේශීය නිෂ්පාදිතයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලෙස පොල් කර්මාන්තය සහ පොල් සම්පත්වල සංවර්ධනය විධිමත් කොට ප්‍රවර්ධනය කිරීම උදෙසා අර්ථාන්විත පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.141/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කිතුල් කර්මාන්තය නගා සිටුවීම උදෙසා කිතුල් වගා කිරීම වැඩි කිරීම,— ග්‍රාමීය කර්මාන්ත කෙරෙහි කිතුල් මගින් සිදු කරනා සුවිශාල දායකත්වය හේතු කොට ගෙන ග්‍රාමීය කර්මාන්ත සහ ග්‍රාමීය ප්‍රජාව නගා සිටුවීම පිණිස වගාවන් තුළ කිතුල් ගහනය වැඩි කිරීම සඳහා වන අපගේ දිරිය සැලසුමට අනුගතව නව කිතුල් වගාවන් සංඛ්‍යාව වැඩි කිරීම උදෙසා නිසි ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් සුරක්ෂිත කිරීම,— තිරසාර ජාතික සංවර්ධනයක් සහ ස්වකීය ජනතාවගේ සහ

ආර්ථිකයේ යහ පැවැත්ම උදෙසා, වසර 2020 වන විට ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් තහවුරු කිරීම පිණිස පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කිරීම— කජු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකැසුම, අලෙවි කිරීම සහ වගා කිරීමට ආධාර කිරීම සහ එමගින් ප්‍රධාන පෙළේ, තත්වයෙන් උසස් සහ වටිනාකම එකතු කළ කජු නිෂ්පාදකයකු සහ අපනයනකරුවකු බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාවට සහාය ලබා දීම පිණිස කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම,— අම්පාර දිස්ත්‍රික්කයේ අභාවයට යන සම්ප්‍රදායික කර්මාන්ත වන අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය, කුඹල් කර්මාන්තය, තල් කොළ හා පන් ගස්වලින් පෙට්ටි, වට්ටි හා පැදුරු විවීම, කොහු කර්මාන්තය හා වේවැල් කර්මාන්තය යනාදිය සංවර්ධනය කර, එම ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථාවන් උදාකර දීමෙන් ඔවුන්ගේ ආදායම නංවාලීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.146/'11

ගරු තිලංග සුමතිපාල මහතා,— ආයුධ වෙළඳාම සඳහා විධිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම,—ජාත්‍යන්තර වශයෙන්, කිසිදු පාලනයකින් තොරව ආයුධ වෙළඳාම ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව වැනි රටවලට ආයුධ ගලා ඒම සහ එම රටවල් තුළ අවිධිමත් ලෙස ආයුධ සංසරණයවීම, ජනසමාජයේ නිදහසට ඉමහත් බාධකයක් ද ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලයට පත් රජයකට තර්ජනයක් හා බලපෑමක් මෙන්ම රට තුළ මත්ද්‍රව්‍ය සහ ගණිකා වෘත්තිය වැනි නීති විරෝධී ක්‍රියාකාරකම් පුළුල් වීම සඳහා හේතුවක්ද වී ඇත. ඉහත තත්ත්වය වළක්වාලමින් විනයගරුක, නීතිගරුක සහ සදාචාර සම්පන්න සමාජයක් ජනිත කිරීම මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි අපේක්ෂාවක් වන බැවින් ද, වර්තමාන ලෝකයේ බලාපොරොත්තුව අවි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම මගින් සමාජ අරගල අවම කර සමාජ සුභ සාධනය සහතික කිරීම වන බැවින් ද, මෙම විෂමාචාරයන් පිටුදැකීම සඳහා ජාත්‍යන්තර ගිවිසුම්වලට හා ප්‍රඥප්තිවලට අදාළව දේශීය නීති පද්ධතියක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රට ඉඳි වගාව හඳුන්වාදීමේ හැකියාව විමසා බැලීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම,— රට ඉඳි ශාඛය (ෆීනික්ස් ඩැක්ටිලිෆෙරා) අප රටේ වගා කිරීම සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිහි සිදු කරන ලද අත්හදා බැලීමක් සාර්ථක බව පෙනී ගොස් ඇති හෙයින්, අප රටේ ජනතාවට අපේම පොළවේ වවන ලද මෙම රසවත් පළතුර භුක්ති විඳීමට අවස්ථාව සලසනු පිණිස, රට ඉඳි වගාව හඳුන්වා දීමේ හැකියාව විමසා බලන පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'11

ගරු රවී කරුණානායක මහතා,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීම,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.152/'11

ගරු රවී කරුණානායක මහතා,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීම,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'11

ගරු රවී කරුණානායක මහතා,— මහ නගර සභාවලට රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා හඳුන්වා දීම,— 2013 ජනවාරි මස 01 වැනි දින වන විට සෑම මහ නගර සභාවකම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා පිහිටුවීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'11

ගරු රවී කරුණානායක මහතා,— හිමිකම් පනත සම්මත කිරීම,— මානව අභිමානය, සමානාත්මතාව සහ නිදහස යන ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් තහවුරු කරන දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන හිමිකම් පනත හා සමානව රටේ සියලු ජනතාවගේ හිමිකම් සහතික කරමින් එම පනතේ නිශ්චිතව දැක්වෙන සීමාවන්ට යටත්ව රාජ්‍යය විසින් ඒවා ගරු කළ යුතු, ආරක්ෂා කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු හා ඉටුකර දිය යුතු බවට විධිවිධාන සලස්වන පනතක් ශ්‍රී ලංකාවේ සම්මත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ දීමනා ගෙවීම,— රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කිසිදු විශේෂ දීමනාවක් නොගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'12

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ වරායන් සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් වාසිදායක ආකාරයට ස්ථානගත වූ කේන්ද්‍රස්ථානයක පිහිටා ඇති බවට ප්‍රචලිතව තිබීමත්, පුරාතනයේ සිටම නැව් ප්‍රවාහන සේවය ඉතා වැදගත් සේවා කර්මාන්තයක් වීමත් සහ ඉන්දියාව ඉතාම අධිෂ්ඨානශීලීව වරායන් සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමෙහි නිරතව සිටීමත් නිසා අප ඉන්දියාව සහ ඉන්දීය ව්‍යාපාර සමග එක් වී දෙරටේම යහපත පිණිස වරායන් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාඛවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාඛවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන්

අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 164/'12

ගරු රවී කරුණානායක මහතා,— සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කිරීම,— දේශපාලන මැදිහත්වීම් සහ දේශපාලන අනුග්‍රහයන්ට විශේෂයෙන් සම්බන්ධ සියලුම බාධකයන් ඉවත් වන පරිදි, සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 165/'12

ගරු රවී කරුණානායක මහතා,— තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට "කලින් ඡන්ද ප්‍රකාශ කිරීම" හඳුන්වා දීම,— වත්මන් මැතිවරණ ක්‍රමය තුළ පවත්නා බොහෝ අඩුපාඩු මගහරවා වඩාත් සතුටුදායක තත්ත්වයකට පත්කිරීමට සහය වනු පිණිස, තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට "කලින් ඡන්ද ප්‍රකාශ කිරීම" හඳුන්වාදීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 166/'12

ගරු රවී කරුණානායක මහතා,— විවෘත ඡන්ද හිමි නාම ලේඛනයක් හඳුන්වාදීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය වර්තමානයෙහි පවත්වාගෙන යන ස්ථාවර ආකාරයේ නාම ලේඛනයක් වෙනුවට විවෘත නාම ලේඛනයක් බවට පත් කරනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.170/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.171/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.172/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රීයව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 පෙබරවාරි මස 19 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1652/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මොනරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කවල වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව සේවයේ නිරතවන පාසල් අනධ්‍යයන සේවකයින්ගේ සේවය මෙතෙක් ස්ථිර කර නොමැති බවත්;

(ii) වර්ෂ 2005 සහ 2008 වර්ෂවලදී බඳවා ගෙන ඇති මෙම පිරිස මේ දක්වා සුළු දෛනික වැටුපකට සේවය කරනු ලබන බවත්;

(iii) එම තත්ත්වය යටතේ ඔවුන් ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම අනධ්‍යයන සේවක පිරිස ස්ථිර කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබියදීත් ඔවුන්ගේ සේවය ස්ථිර නොකිරීමට හේතු කවරේද;

(ii) එම හේතු මගහරවා ඔවුන් ස්ථිර සේවක පිරිසට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2185/'11

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමට අදාළව පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) උපයෝජිත සමස්ත ප්‍රාග්ධනය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) සමස්ත කාර්ය මණ්ඩලය සඳහා දරන ලද පිරිවැය සහ එක් සේවකයකුගෙන් ඉපැයූ ලාභය කොපමණද;

(iv) එක් මගියකු වෙනුවෙන් දැරූ පිරිවැය කොපමණද;

(v) රජය වෙත ගෙවනු ලැබූ තීරු බදු හෝ අනෙකුත් බදු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලබාදී ඇති ප්‍රාග්ධනය, මුදල්, ණය සහ ඇපකර කවරේද;

(ii) ඒවා පිළිබඳ විස්තර කවරේද;

(iii) ඒවා ලබාදී ඇත්තේ කවර කාර්යයන් සඳහාද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඇ) සීමාසහිත ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් මෙතෙක් ගෙවා නොමැති සමස්ත ණය ප්‍රමාණය කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2280/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ පාසල් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය ඇති කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථාන ඇති කරන ලද වර්ෂය කවරේද;

(ii) දිවයින පුරා පිහිටුවා ඇති එම පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) ආරම්භක වර්ෂයේ සිට එකී මධ්‍යස්ථාන සඳහා පත්කර ඇති කළමනාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කළමනාකරුවන් අධ්‍යාපනඥ සේවයට ඇතුළත්කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආරම්භක වර්ෂයේ සිට මේ දක්වා එම මධ්‍යස්ථාන මගින් ගුරුවරුන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ආරම්භක වර්ෂයේ සිට මේ දක්වා එම මධ්‍යස්ථාන මගින් වෘත්තීය පුහුණුව ලබා දී ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2342/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මඟින් ළමාවියේ දී මන්ද පෝෂණයට හෝ ඌන පෝෂණයට ලක්වන දරුවන් එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා අවශ්‍ය සියලුම වර්ගවල කිරි, බෙහෙත්, විටමින් හා ආහාර ද්‍රව්‍ය ජන සභාව හරහා බෙදා හැරීමට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන ජන සභා කාර්යාල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2381/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා විදේශ සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව එක් එක් ශ්‍රේණිය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ වන විට,

(i) ශ්‍රී ලංකා විදේශ සේවයේ සිටින, තරඟ විභාග සමත්ව සේවයට ඇතුළත්වූ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) ශ්‍රී ලංකා විදේශ සේවයට පිටස්තරව තානාපති කාර්යාලයන්හි සේවයට බඳවාගෙන ඇති රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව;

(iii) ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සේවය කරන නිත්‍ය රාජ්‍ය සේවයේ නොවන වෙනත් නිලධාරීන් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ආ(ii) හා (iii) හි විමසා ඇති නිලධාරීන්ගේ නම්, තනතුරු සහ බඳවා ගෙන ඇති වර්ෂයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකා විදේශ සේවයට පිටස්තරව තානාපති කාර්යාල සේවය සඳහා නිලධාරීන් පත් කිරීමේදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2870/’12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දෘෂ්‍ය හා ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලය මගින් ප්‍රවේශ අවශ්‍යතාවයක් ලෙස ක්‍රියාත්මක කරන ලද අභියෝගතා පරීක්ෂණය නතර කිරීමට හේතු කවරේද;

(ii) ඉහත කී අභියෝගතා පරීක්ෂණය නතර කිරීම සඳහා වූ තීරණය ගැනීමට පෙර විශ්වවිද්‍යාල නිලධාරීන් සමග සාකච්ඡා කිසිවක් පවත්වන ලද්දේද;

(iii) නොඑසේ නම්, එවැනි සාකච්ඡාවක් නොපැවැත්වීමට හේතු කවරේද;

(iv) එසේ නම්, ප්‍රවේශ අවශ්‍යතාවයක් ලෙස අභියෝගතා පරීක්ෂණය පැවැත්වීම නතර කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල නිලධාරීන් දරන ලද ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තම හිතවත් අයදුම්කරුවන්ට කථිකාචාර්යවරුන් පක්ෂපාතී වන්නේය යන පදනම මත අභියෝගතා පරීක්ෂණය දූෂිත බවට අයදුම්කරුවන්ගෙන් අමාත්‍යාංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පෙත්සම් ලැබී තිබේද;

(ii) එසේ නම්. මේ සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් හෝ පරීක්ෂණයක් නොපැවැත්වීමට හේතුව කවරේද;

(iii) ඉහත කී අභියෝගතා පරීක්ෂණයේ විනිවිදභාවය වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය උත්සාහ දරනු ලැබ තිබුනේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2917/’12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධිකරණයට අපහාස කිරීම පිළිබඳ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන කාර්ය පටිපාටික නීතියක් නොපවතින බවත්;

(ii) ශ්‍රී ලංකාව තුළ අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටික නීතියක් පැනවීම සිදුකළයුතු බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් “ටොනි ෆනැන්ඩු” නඩුවේදී නිර්දේශකර ඇති බවත්;

(iii) අධිකරණයට අපහාසකිරීම පිළිබඳ කාර්ය පටිපාටික නීති කෙටුම්පතක් ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් අනුමත කොට, අධිකරණ අමාත්‍යාංශය වෙත ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ අධිකරණයට අපහාස කිරීමට අදාළව කාර්ය පටිපාටික නීතියක් ඉක්මනින් පැනවිය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1953/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රදේශයේ, තල්ගම්පල, ගොනාමුල්ල වැවේගොඩ තේ කර්මාන්තශාලාව වර්ෂ පහක පමණ කාලයක සිට වසා දමා ඇති බවත්;

(ii) එම නිසා ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ට තම තේ දළු අලෙවි කර ගැනීමේදී ගැටලු රැසකට මුහුණ පෑමට සිදුව ඇති බවත්;

(iii) ඉහත කර්මාන්තශාලාව තුළ රුපියල් කෝටියකට වඩා වටිනා දේපළ දිරාපත්වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තේ කම්හල වසා දැමීමට හේතු වූ කරුණු කවරේද;

(ii) එවැනි තේ කම්හලක් විනාශ වී යාමට හැරීම ජාතික අපරාධයක් බැවින් එහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2282/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ පෙරහැර පැවැත්වීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) දළදා පෙරහැර සඳහා දළදා මාළිගා අරමුදලින් වියදම් කළ මුදල කොපමණද;

(iii) ඒ සඳහා රාජ්‍ය ආයතනවලින් ලබාගත් මුදල කොපමණද;

(iv) මුදල් ලබා දුන් රාජ්‍ය ආයතන සහ එම එක් එක් ආයතනයෙන් ලබා දුන් මුදල කොපමණද;

(v) පෞද්ගලික ආයතනයන්ගෙන් ලබාගත් මුදල කොපමණද;

(vi) මුදල් ලබා දුන් පෞද්ගලික ආයතන සහ එම එක් එක් ආයතනයේ ලබා දුන් මුදල කොපමණද;

යන්න වර්ෂ 2009 සිට 2011 දක්වා කාල සීමාව සඳහා වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2343/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මගින් ලංකාවේ උපදින සෑම දරුවකුගේම ජීවදත්ත ගොනුවක් එම දරුවාගේ ස්ථිර පදිංචියට අදාළ ජන සහා ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යා යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම යෝජනාව ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2464/'12

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009, 2010, 2011 සහ 2012 යන වර්ෂයන්හිදී,

(i) රජය විසින් අවධානය යොමු කරන ලද විභවතාවක් ඇති කර්මාන්ත (Thrust Industries) කවරේද;

(ii) වාර්ෂික පදනමින් එම ක්ෂේත්‍රයන් සඳහා කරන ලද ආයෝජනයන් කවරේද;

(iii) එම ක්ෂේත්‍රයන්හි වර්ෂයකට ජනනය කරන ලද අමතර රැකියා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කරන ලද කර්මාන්තවලට පෙර පිරිනමන ලද සහ දැනට පිරිනමනු ලබන බදු සහන සහ දිරි දීමනා යනාදිය කවරේද;

(ii) 2009, 2010, 2011 සහ 2012 වර්ෂ සඳහා ඉහත සඳහන් කර්මාන්ත මත පැනවූ බදුවලින් ලබා ගනු ලැබූ මුළු ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1955/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා විද්‍යාලයට පෞද්ගලික හිමිකරුවකු විසින් වර්ෂ තුනකට පමණ පෙර පරිත්‍යාග කරන ලද අම්බලන්ගොඩ විලේගොඩ පිහිටි තෙමහල් නිවස මේ දක්වා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන දිරාපත්වෙමින් පවතින බවත්;

(ii) අබලන් තත්ත්වයේ පවතින ඉහත නිවස පාසලේ අධ්‍යාපනය ලබන සිසුවියන්ගේ ජීවිතවලට තර්ජනයක්ව ඇති බවත්;

(iii) එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර එම ස්ථානයේ රැස්වීම් ශාලාවක් ඉදිකර දෙන ලෙස විදුහල්පතිතුමිය විසින් අවස්ථා ගණනාවකදී අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිතුමියගේ ඉහත ඉල්ලීම අනුව කටයුතු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2344/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දූෂිත පාරිසරික තත්ත්වයන් හේතුවෙන් ජනතාව රෝගීවීම වළක්වා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව කටයුතු කළ යුතු බවට වන මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ සඳහන් යෝජනාව පරිදි ක්‍රියා කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිපත්ති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2373/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමේ වර්තමාන සභාපතිවරයා කවුරුන්ද;
(ii) ඔහුගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;
(iii) ඔහුගේ වැටුප කොපමණද;
(iv) වෙනත් දීමනා ලබාගත්තේ නම්, එම දීමනා කවරේද;
(v) එම එක් එක් දීමනාවන්හි අගයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමේ සිටින අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;
(ii) එම එක් එක් අධ්‍යක්ෂවරයාගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් කවරේද;
(iii) ඔවුන්ට ලබා දෙන දීමනාවල අගයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමේ උප සභාපතිවරයෙකු හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු සිටින්නේද;
(ii) එසේ නම්, ඔහුගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;
(iii) ඔහුට හිමි වැටුප්, වේතන හා වෙනත් දීමනාවන්හි අගයන් කවරේද;

යන්නත් එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2466/'12

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) වී වගාව සඳහා සහනාධාර ලබා දීම සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;
(ii) යල හා මහ කන්නවල මුළු වී අස්වැන්න කොපමණද;
(iii) එක් එක් දිස්ත්‍රික්කයෙහි අක්කරයකින් ලැබූ සාමාන්‍ය අස්වනු ප්‍රමාණය කොපමණද;
(iv) යල සහ මහ කන්නවල වී අස්වනු ප්‍රමාණයන් 2005 වර්ෂයේ යල සහ මහ කන්න හා සංසන්දනාත්මකව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ගොවීන්ට ලබාදුන් සහනාධාරය ඔවුන්ගේ නිෂ්පාදනය වැඩි කිරීමටත්, රටේ වී අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීමටත් ඉවහල් වී තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 පෙබරවාරි මස 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1957/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ පිහිටි මාවරල පොලිස් ස්ථානය සතු සියලු ගොඩනැගිලි ඉතා අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) එම තත්ත්වය එහි රාජකාරියේ නියුතු නිලධාරීන්ගේ ජීවිතවලට තර්ජනයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාවරල පොලිස් ස්ථානය සඳහා නව ගොඩනැගිලි ඉදිකර එහි සේවයේ නියුතු නිලධාරීන්ට සහ සේවය ලබන ප්‍රදේශයේ ජනතාවට පහසුකම් සලසාදීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2356/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 සිට 2011 දක්වා අමාත්‍යාංශය වෙත ලැබුණු "මාස දහයක වැටුප් අත්තිකාරම්" ණය ඉල්ලුම්පත් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද,

(ii) එම ඉල්ලුම්පත් අතුරෙන් එක් එක් වර්ෂය සඳහා ගෙවන ලද වැටුප් අත්තිකාරම් ණය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හදිසි මුදල් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ඉල්ලා සිටින එම ණය මුදල් ගෙවීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(ii) වර්ෂ 2011 දක්වා ලැබී ඇති, දැනට ගෙවීම් සිදුකර නොමැති වැටුප් අත්තිකාරම් ණය ඉල්ලුම්පත්වලට අදාළ ගෙවීම් කිරීම අවසන් කරන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2384/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වංචා හෝ අක්‍රමිකතා විමර්ශන කටයුතු සඳහා විමර්ශන නිලධාරියෙකු පත් කර තිබේද;

(ii) එසේ නම්, ඔහු පත් කරන ලද දිනය කවරේද;

(iii) එම පත්වීම සිදුකළ බලධාරියා කවුරුන්ද;

(iv) එම නිලධාරියාට මාසිකව ගෙවනු ලබන වැටුප, දීමනා සහ හිමිවන අනෙකුත් පහසුකම් කවරේද;

(v) පත් කළ දින සිට මේ දක්වා එම නිලධාරියා විසින් විමර්ශනය කර ඇති වංචා හෝ අක්‍රමිකතා කවරේද;

(vi) ඒවා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(vii) ඔහුගේ සේවා කාලය අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2467/'12

ගරු රවී කරුණානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සහනාධාර පදනම මත පොහොර ලබා දෙන්නේ කවුරුන් හටද;

(ii) සහනාධාර පදනම මත එක් ගොවියෙකුට ලබා දෙන පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) සහනාධාර මත ලබාදෙන පොහොර ලබාගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ගොවියෙකු අනුගමනය කළ යුතු ක්‍රියාදාමය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොහොර සහනාධාරය ලබාදීම පිණිස 2010, 2011 සහ 2012 වර්ෂයන් තුළ සත්‍ය වශයෙන් වැයකළ මුදල් ප්‍රමාණයන් දිස්ත්‍රික් පදනමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සහනාධාරය සඳහා සත්‍ය වශයෙන් ගෙවීම් සිදුකිරීම සඳහා අවශ්‍යවන මුදල් ප්‍රවාහය කවරේද;

(iii) ඉහත කී වර්ෂයන්හි අයවැය ලේඛනවලින් පොහොර සහනාධාරය සඳහා වෙන් කිරීමට යෝජනා කරන ලද මුදල් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2919/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1977.02.14 දින සිට 2009.05.19 දින දක්වා ශ්‍රී ලංකාවේ යුද්ධය පැවති කාලසීමාව තුළ සේවයේ යෙදී සිටි පොලිස් නිලධාරීන්ගේ මව සහ පියා වෙනුවෙන් රුපියල් 750/-ක මාසික දීමනාවක් ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ යටතේ මාසික දීමනා ලබාදෙන මව්වරුන්ගේ සහ පියවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් දීමනාව සඳහා අවශ්‍ය මුදල් රජය විසින් සපයන්නේද;

(ii) නොඑසේ නම්, එම මුදල සපයාගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පොලිස් නිලධාරීන්ගේ දෙමාපියන් වෙනුවෙන් රුපියල් 750/-ක මාසික දීමනාවක් ගෙවීම ප්‍රමාණවත්ද;

(ii) එසේ නම්, එම ප්‍රමාණවත් බව සනාථ කිරීමට පදනම්කරගත් තර්කය කුමක්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2959/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර අධ්‍යාපන කලාපය තුළ, 2012 පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සිසුන් වෙනුවෙන් ලබාදුන් පෙරහුරු ප්‍රශ්න පත්‍රවල විශාල වැරදි සංඛ්‍යාවක් තිබී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ ප්‍රශ්න පත්‍ර සිසුන් හට ලබාදීමට පෙර ඒවායේ පවතින දෝෂ නිවැරදි කිරීමට බලධාරීන් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටීමේ ආසන්න අවස්ථාවේ වැරදි සහිත පෙරහුරු ප්‍රශ්න පත්‍ර ලබා දී සිසුන්ට සිදුකර ඇති හානිය වෙනුවෙන් වගකිව යුතු පාර්ශ්වයන් කවරේද;

(iii) ඉහත පරිදි ගැටලුකාරී තත්වයන් නැවත ඇති නොවන පරිදි වගකීමකින් යුතුව ක්‍රියා කරන නිලධාරීන් පිරිසක් අදාළ තනතුරු සඳහා අනුයුක්ත කිරීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2994/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය සේවයේ මේ වනවිට පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු සංඛ්‍යාව තනතුරු නාම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෑතකදී සංවර්ධන සහකාර ලෙස බඳවාගත් දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින සමස්ත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ බඳවාගත් උපාධිධාරීන් සංඛ්‍යාව පළාත් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3004/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තැපැල් කාර්යයන් සඳහා වඩාත් ජනප්‍රිය කුමන වටිනාකමක මුද්දරද යන්න එම ජනප්‍රියත්වයේ අනුපිළිවෙළින් කවරේද;

(ii) රු. 5/= ක වටිනාකමින් යුත් මුද්දරයක සාමාන්‍ය ප්‍රමාණය සෙ.මී. 2 x සෙ.මී. 2.5ක් වේද;

(iii) නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ (Institute of Ship Brokers) 25 වැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් මුද්‍රිත රු. 5/= ක වටිනාකමින් යුත් මුද්දරයේ දිග සහ පළල කොපමණද;

(iv) පේරාදෙණිය සංගිලි පාලම සහ මහකන්දරාවේ ඉපැරණි ගල් පාලම මුද්‍රිත රු. 10/=ක වටිනාකමින් යුත් මුද්දර දෙකේ දිග සහ පළල කොපමණද;

(v) ඉහත (iii) සහ (iv) හි සඳහන් කළ එක් එක් මුද්දරයේ සහ මුද්දරවල, කඩදාසි, මුද්‍රණ, ප්‍රවාහන, ගබඩාකරණ සහ බෙදාහැරීම් යනාදී වියදම් ද ඇතුළත් සමස්ත පිරිවැය කොපමණද;

(vi) සෙ.මී. 2 x සෙ.මී. 2.5ක සාමාන්‍ය ප්‍රමාණයේ රු. 5/= මුද්දරයක වියදම සමඟ ඉහත (iii) සහ (iv) හි සඳහන් එකිනෙක මුද්දරයක වියදම සන්සන්දනාත්මකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3098/'12

ගරු පී. හැරිසන් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ රොන්මඩ ඉවත් කිරීම සඳහා තෝරාගෙන ඇති මුළු වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන් එම වැව් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් වැව සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග හා ගොවිජන සේවා නිලධාරීන්ගේ සහාය ලබා ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා වෙනත් අයගේ සහාය ලබා ගන්නේද;

(iii) එසේ නම්, එම අය කවුරුන්ද;

(iv) ඔවුන් අයත් ආයතන කවරේද;

(v) ඉහත සඳහන් එක් එක් වැවෙන් රොන්මඩ ඉවත් කර ඇති අක්කර ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) රොන්මඩ ඉවත්කළ පසු එම වැව්වල කන්න දෙක වගා කිරීමට ප්‍රමාණවත් ජලය රැස්කරගත හැකිවේද;

(vii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වැව්වල රොන්මඩ වාර්ෂිකව ඉවත් කරන්නේද;

(ii) නොඑසේ නම්, එය සිදු කරන කාල පරාසය කුමක්ද;

(iii) මෙවර රොන්මඩ ඉවත් කිරීමට නොහැකිවූ වැව්වල එම කටයුතු ඉදිරි යල කන්නයේදී සිදුකරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3135/'12

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතලේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි නාලන්ද කර්මාන්තපුරය තුළ දැනට,

(i) නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඉදිවෙමින් පවතින කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) ඉදිකිරීමට යෝජිත කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කර්මාන්තපුරය සඳහා වෙන් කර ඇති සමස්ත භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම කර්මාන්තපුරය තුළ එක් කර්මාන්තශාලාවකට ලබාදෙන උපරිම හා අවම භූමි ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (අ) හි සඳහන් එක් එක් කර්මාන්තශාලාව වෙනුවෙන් වෙන් කර දී ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ඉඩම් ලබාදීමේ පදනම කොපමණද;

(v) මේ වන විට ව්‍යාපෘතීන් සඳහා වෙන්කර දී ඇති මුළු ඉඩම් ප්‍රමාණය සහ ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(vi) එම කර්මාන්තපුරය තුළ කර්මාන්ත අරඹා ඇති කර්මාන්තශාලා හිමියන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නාලන්ද කර්මාන්තපුරයට අයත් භූමියෙන් පෞද්ගලික පරිහරණය සඳහා ඉඩම් කොටස් ලබා දීමට හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, එය සිදුකරනු ලබන පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3139/’12

ගරු අබ්දුල් හලීම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හාරිස්පත්තුව සංවර්ධන පදනම නමැති ආයතනය මගින් 1994 වර්ෂයේදී හල්ලොලුව, වරාතැන්න මහවැලි ගඟ මැද පිහිටි ඓතිහාසික ස්ථානයක ඉදිකර, සංඝ රත්නයට පූජාකළ උදකුක්ඛේප සීමාමාලකය උඩරට අමරපුර සංඝ නිකායේ උපසම්පදා විනය කර්ම සිදු කරන ස්ථානය බවත්;

(ii) මේ වන විට එකී පූජනීය ස්ථානය ඉවත් කර එම ස්ථානයේ පෞද්ගලික විදුලි බලාගාරයක් ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුවන බවත්;

(iii) ඓතිහාසික වැදගත්කමක් ඇති එම පූජනීය ස්ථානය විනාශ කිරීම සම්බන්ධයෙන් දැඩි කලකිරීමට පත්ව ඇති අමරපුර නිකායට අදාළ දිවයින පුරා සිටින ගිහි, පැවිදි බොහෝ පිරිසක් ඊට එරෙහිව විරෝධතාවයකට සූදානම් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උඩරට අමරපුර නිකායේ පරිහානියට තුඩු දෙන එම පෞද්ගලික විදුලි බලාගාරය ඉදි කිරීමේ කටයුතු වහාම නතර කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඓතිහාසික හා පාරම්පරික වටිනාකමක් ඇති උදකුක්ඛේප සීමාමාලකය තුළ ඉදිරියටත් බාධාවකින් තොරව එකී නිකායේ විනය කර්ම සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1958/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති හලාවත මහ රෝහලෙහි දැනට පවතින භෞතික සම්පත්වල ඌනතාවන් හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව තම සෞඛ්‍ය සේවාවන් ලබාගැනීමේදී දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) හලාවත මහ රෝහලෙහි පවත්නා අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කර ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විට සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2362/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උලහිටියාව බටහිර ග්‍රාම නිලධාරි වසමේ, වැලිපිටිය - ඉඹුල්ගොඩ මාර්ගයේ අඹගස්ආර හංදියේ සිට ඉදිරියට කිලෝ මීටර් 1 1/2 ක් පමණ කොන්ක්‍රීට් අතුරා ඇති බවත්;

(ii) පළාත් නිශ්චිත ප්‍රතිපාදනවලින් රු. 1,287,312/- ක පමණ ඇස්තමේන්තුවක් එම කටයුත්ත සඳහා ඉදිරිපත් කර ඇති බවත්;

(iii) නියමිත ප්‍රමිතීන්ට අනුව පිළිසකර නොකිරීම නිසා දැනටමත් එම මාර්ගය ගිලා බැස ඇති බවත්;

(iv) එසේ වුවද ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ හා කාර්මික නිලධාරියාගේ විරුද්ධත්වය නොතකා රජයේ වගකිව යුතු නිලධාරීන්ගේ බලපෑම් මත එහි කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාර්ගයේ ඉදිකිරීම් පිළිබඳ ස්ථානීය තත්ත්ව පරීක්ෂණ වාර්තාවන් ලබාගෙන මෙම මුදල් නාස්තිය පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයථා ලෙස ගෙවා ඇති මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2386/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් විමර්ෂණ කටයුතු සිදුකර ඇති ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) විමර්ෂණය කිරීමට ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) විමර්ෂණය කිරීමට ඇති පැමිණිලි එම වර්ෂය තුළදීම විමර්ෂණය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළ මානව හිමිකම් කඩ කිරීම සම්බන්ධයෙන් පැමිණිලි ලැබී ඇති ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනය සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අනුව වැඩිම චෝදනා සංඛ්‍යාවක් එල්ල වී ඇති ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2468/'12

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් ළමුන්ට නිල ඇඳුම් සඳහා රෙදි ලබාදීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම වැඩසටහන ආරම්භ කරනු ලැබුවේ කවරෙකු විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2011 සහ 2012 වර්ෂවලදී;

(i) ඉහත වැඩසටහන තුළින් ප්‍රතිලාභ ලැබූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩසටහන සඳහා වෙන්කරනු ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම වැඩසටහන සඳහා සත්‍ය වශයෙන් වැයකළ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පාසල් නිල ඇඳුම් සඳහා ලබාදෙන රෙදි වර්ග දේශීයව නිපදවූ ඒවාද; නොඑසේ නම්, ආනයනය කළ ඒවාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 පෙබරවාරි මස 21 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1959/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කලාප අධ්‍යාපන කාර්යාලය මගින් පාලනය වන පිලගොඩ කණිෂ්ඨ විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ වහලය අබලන්වී කඩා වැටීමට ආසන්නව පවතින බවත්;

(ii) එම තත්ත්වය පාසලේ සිසු දරු දැරියන්ගේ ජීවිතවලට තර්ජනයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අබලන්ව ඇති එම ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2364/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මූලික රෝහලක් ලෙස උසස් කරන ලද තිස්සමහාරාම රෝහලෙහි සේවය සඳහා,

(i) පරිපාලනය හා චර්යා පිළිවෙත් සැලසුම් සහගතව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය රෝහල් අධ්‍යක්ෂවරයෙකු පත්කර තිබේද;

(ii) සර්වාංග රෝග, ළමා රෝග, ප්‍රසව හා නාරි, ශල්‍ය හා නිර්වින්දන ආදී ප්‍රධාන විශේෂඥ වෛද්‍යවරු සහ ඔවුන්ට සහයවන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් අවශ්‍ය ප්‍රමාණයට පත්කර තිබේද;

(iii) ඉහත සඳහන් වෛද්‍යවරු පත්කර ඇත්නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) ප්‍රධාන හෙද පාලිකාවන්, හෙද, හෙදි නිලධාරීන් හා අවශ්‍ය ප්‍රමාණයට සාත්තු සේවිකාවන් සහ කම්කරුවන් පත්කර තිබේද;

(v) ඉහත තනතුරුවලට අදාළ පත්කිරීම් සිදුකර තිබේ නම්, එක් එක් කාණ්ඩය යටතේ පත්කළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මූලික රෝහලක් වුවද තවදුරටත් තිස්සමහාරාම රෝහලෙහි පවත්නා අඩුපාඩු සපුරා එය යථා තත්ත්වයට පත්කිරීමට කොපමණ කාලයක් ගතවන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2411/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012.02.11 දින හෝ ඊට ආසන්න දිනක සිදුකළ ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් අපහසුතාවට පත්ව ඇති කුලී ත්‍රීරෝද රථ හිමියන්ට සහන සැලසීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ත්‍රිරෝද රථ හිමියන්ට ඉන්ධන සහනාධාරයක් ලබාදෙන්නේද;

(iii) එසේ නම්, එය ලබාදෙන ක්‍රමවේදය කවරේද;

(iv) මෙම සහනාධාරය ලබා දීම සිදුකරන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කුලී ත්‍රිරෝද රථ හිමියන්ට ඉන්ධන සහනාධාරයක් ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

(ii) රටට බරක් නොවී ස්වයං රැකියාවක යෙදෙමින් සමාජයට ද සේවාවක් ලබා දෙමින් කටයුතු කරන එම පිරිසට සහන ලබා නොදීම බලවත් අසාධාරණයක් නොවන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2681/'12

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති නොතකා සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගම පෞද්ගලීකරණය කිරීමට හෝ එහි කළමනාකාරිත්වය පෞද්ගලික අංශයට පැවරීමට හේතුව කවරේද;

(ii) එහි නව හිමිකරුවන්ගේ හෝ කළමනාකරණ හවුල්කරුවන්ගේ නම් සහ අදාල ගිවිසුම කවරේද;

(iii) එහි කළමනාකරණ ගිණුම් ඉදිරිපත් කරන ලද දිනය කවරේද;

(iv) නොඑසේ නම්, ඒවා ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගමට අයත් ඉඩම් විදේශිකයින්ට විකිණීමට හේතු කවරේද;

(ii) ඉඩම්වල විකුණුම් මිල කොපමණද;

(iii) ඉහත කී ගනුදෙනුවට අදාළ 100% බද්ද ගෙවා තිබේද;

(iv) එසේ නම්, එය ගෙවන ලද දිනය කවරේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත කී ඉඩම් ගනුදෙනුව සම්බන්ධයෙන් ටෙන්ඩර් කැඳවීමක් සිදු කරන ලද්දේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් උපදේශක කමිටුවේ හෝ තේරීම් කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

(iii) නොඑසේ නම්, එය සිදු කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2936/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1996-2006 දක්වා කාලය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිදුවූ රු. 245,783,998.72ක වංචාවක් හෙළිදරව් නොකිරීම සම්බන්ධව රජයේ විගණනය භාර අධීක්ෂණ නිලධාරීන්ගේ වගකීම් පිළිබඳව පරීක්ෂා කිරීමට විගණකාධිපතිගේ අංක: S-1/12/14(xiii) හා 2008 ජනවාරි මස නියෝගයෙන් සිදුකළ පරීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ලබාදුන් දිනය;

(ii) එම වාර්තාවේ නිර්දේශ;

(iii) එම කාල සීමාවේදී ඉහත ආයතනයේ විගණනය භාරව සිටි පරීක්ෂණ නිලධාරීන් හා වෘත්තීය අධීක්ෂණ නිලධාරීන්ගේ නම් සහ වර්තමානයේ ඔවුන් දරන තනතුරු;

(iv) ඉහත නිර්දේශ අනුව වගවීමට හා වරදට යටත් නිලධාරීන්ට එරෙහිව ගත් විනය හා නීති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2961/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදල යටතේ රුපියල් ලක්ෂ දහහතක් වැයකොට ඉදිකිරීමට වර්ෂ 2003 දී මුල්ගල තැබූ යටදොල ජල ව්‍යාපෘතියේ අඩක් මේ වන විට නිම කර ඇති බවත්;

(ii) එම තත්ත්වය යටතේ යටදොල කනිෂ්ඨ විද්‍යාලයේ සිසු දරුවන්ගේ පානීය ජල අවශ්‍යතාවයන් සම්පූර්ණ ලෙස සපුරාගත නොහැකිව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යටදොල ජල ව්‍යාපෘතිය අඩක් නිම කිරීමට හේතු කවරේද;

(ii) යටදොල ගම්වාසීන්ගේ සහ යටදොල කනිෂ්ඨ විද්‍යාලයේ දරුවන්ගේ පානීය ජල අවශ්‍යතාව පූර්ණ වශයෙන් සලසාදීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2996/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට රාජ්‍ය සේවය තුළ සිටින කළමනාකරණ සහකාරවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් 2011 සහ 2012 වර්ෂයන්හිදී බඳවාගත් කළමනාකරණ සහකාරවරුන්ගේ සංඛ්‍යාව එක් එක් ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විවිධ රාජ්‍ය ආයතනවල රාජකාරී සඳහා නිසි වැඩපිළිවෙළකින් තොරව උපාධිධාරීන් අනුයුක්ත කිරීම නිසා කළමනාකරණ සහකාර තනතුරුවල ගැටලුවක් මතුව තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) එම ගැටලුව විසඳීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3006/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අරමුණු වනුයේ රජයේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශනයේ දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ මූල්‍ය කාර්යසාධනය ඇගයීමට මහජනතාවට අවස්ථාව ලබාදීම බවත්;

(ii) වියදම, ආදායම, මුදල් ප්‍රවාහ සහ ණය ගැනීම සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ පළමු මාස හතර සඳහා ඇස්තමේන්තුගත සහ තථ්‍ය මුදල් ප්‍රමාණ පිළිබඳ ප්‍රකාශනයක් එකී වාර්තාවේ අන්තර්ගත විය යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 2012 ජූනි 29 දිනැති 2012 සඳහා වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි, 2012 පළමු මාස හතර සඳහා,

(i) ඇස්තමේන්තුගත සහ තථ්‍ය වියදම;

(ii) ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම;

(iii) ඇස්තමේන්තුගත සහ තථ්‍ය මුදල් ප්‍රවාහය;

(iv) ඇස්තමේන්තුගත සහ තථ්‍ය ණය ගැනීම්;

ඇතුළත්ව තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3100/'12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරු මැද පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ වසා ඇති පාසල් සංඛ්‍යාව;

(iii) සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව;

(iv) පවතින සම්පූර්ණ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(v) එක් එක් විෂය අනුව පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(vi) වැඩබලන විදුහල්පතිවරු සංඛ්‍යාව;

(vii) ශ්‍රේණිධාරී ගුරුවරු සංඛ්‍යාව;

(viii) ස්වෙච්ඡා ගුරුවරු සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරුමැද පළාතේ, පොළොන්නරුව හා අනුරාධපුර දිස්ත්‍රික්කවල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන් සඳහා වැටුප් ගෙවන්නේද;

(ii) එසේ නම්, එම වැටුප කොපමණද;

(iii) ඉහත දිස්ත්‍රික්කවල රජයේ පාසල්වල ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් සේවය කරන්නේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ හෝ වෙනත් ආයතනයක් යටතේ ගුරු පුහුණුවක් ලබා දී තිබේද;

(vi) ඔවුන් ඉදිරියේදී ගුරු සේවයට අනුයුක්ත කිරීමට අපේක්ෂිතද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1960/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ විශ්වවිද්‍යාලයන්හි මෙතෙක් ආරක්‍ෂක කටයුතු කළ සමාගම් සමඟ පැවති ගිවිසුම් නියමිත කාලය සම්පූර්ණවීමට පෙර අවලංගු කර ඔවුන්ගෙන් සේවා ලබා ගැනීම නවතා ඇති බවත්;

(ii) එම ආරක්ෂක සේවා සැපයීම වෙනත් පෞද්ගලික ආරක්‍ෂක සමාගම් කිහිපයකට පවරා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාලයන්හි ආරක්ෂක කටයුතු පවරා ඇති නව සමාගම්වල නම් කවරේද;

(ii) එම එක් එක් සමාගමේ හිමිකරුවන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් නව සමාගම්වලට ආරක්‍ෂක කටයුතු පැවරීමේදී ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබූ ආයතනවල නම් කවරේද;

(iii) ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකළේ නම්, ඊට හේතු කවරේද;

(iv) විශ්වවිද්‍යාල ආරක්ෂක සේවයේ නියුතු ආරක්ෂක නිලධාරීන් සඳහා තිබිය යුතු අවම සුදුසුකම් හා ඔවුන්ට හිමි වරප්‍රසාද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2365/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතෙන් ස්ථාපනය කරන ලද ගොවි විශ්‍රාම වැටුප සඳහා ගොවීන්ට දායකත්වය ලබාදීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විටත් ඒ සඳහා ගොවීන් බඳවා ගැනීම සිදු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම වැටුප් දායකත්වය ලබාගත් ගොවීන්ගෙන් අද වන විට අයකර ගෙන ඇති මුළු දායක මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) වයස අවුරුදු 60 ඉක්මවූ, මේ වනවිට විශ්‍රාම ගොස් ඇති ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් ගොවි විශ්‍රාමිකයෙකු සඳහා ගෙවන ලද අවම මාසික විශ්‍රාම වැටුප කොපමණද;

(iv) 2011 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ගෙවන ලද මුළු විශ්‍රාමික වැටුප් මුදල කොපමණද;

(v) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම මාස්පතා සිදු කර නොමැති නම්, එය එසේ ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2413/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012. 02. 11 දින හෝ ඊට ආසන්න දිනක සිදුකළ ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් අපහසුතාවට පත්ව ඇති ධීවර ජනතාවට සහන සැලසීම සඳහා ගෙන ඇති හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ධීවර ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එය ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) එම සහනාධාරය ලබා දෙනු ලබන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවර ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

(ii) දැඩි ජීවිත අවදානමකට මුහුණ දෙමින් රටේ ආර්ථිකයට විශාල මෙහෙයක් ඉටුකරන ධීවර ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා නොදීම බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2683/'12

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත බී. සී. සී. ලංකා ආයතනය අවසන්වරට ක්‍රියාත්මක වූ දිනය කවරේද;

(ii) සීමාසහිත බී. සී. සී. ලංකා ආයතනයේ මේ දක්වා වූ ගිණුම් කවරේද;

(iii) ආයතනයේ වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාසහිත බී. සී. සී. ලංකා ආයතනයට අයත්ව තිබූ පර්චස් 212ක් විකිණීමට හේතුව කවරේද;

(ii) ඉහත කී ඉඩම විකුණනු ලැබුයේ කවර පුද්ගලයකුටද;

(iii) ඉහත කී ගනුදෙනුව නිසි ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර සිදු කරනු ලැබුවේද;

(iv) නොඑසේ නම්, ටෙන්ඩර් පටිපාටීන් අනුගමනය නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කාර්ය මණ්ඩලයට වන්දි ගෙවා තිබේද;

(ii) එසේ නම්, එක් එක් පුද්ගලයාට ගෙවන ලද වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ට වන්දි ගෙවීම සිදු කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3040/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැදුරුඔය දෙපස කිලෝමීටර් 40ක් දුරට යෝධ කුඹුක් ගස් කපන ජාවාරමක් සිදුවන බවත්;

(ii) සීරන්ගොඩ ප්‍රදේශයේ ගම්වාසීන් විසින් 2012 ජූනි 01 වැනි දින කුරුණෑගල පොලිස් ස්ථානයේ දූෂණ මර්දන ඒකකයට කළ පැමිණිල්ලක් අනුව ඉහත සඳහන් දැව ජාවාරම සිදුකළ අය අත්අඩංගුවට ගෙන තිබුණු බවත්;

(iii) 2012 ජූනි 01 වැනි දින ප.ව. 3.00ට අත්අඩංගුවට ගත් එම ජාවාරම්කරුවන් එදිනම ප.ව. 6.30 - ප.ව. 7.00ත් අතර මුදා හළ බවත්;

(iv) එම වැටලීම සිදු කළ පොලිස් නිලධාරියාට සති දෙකකට පසු වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුවක් ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වාරියපොල - ඇල්ල ප්‍රදේශයේ සිට වැල්ලව, ගනේවත්ත ප්‍රදේශය දක්වා දැදුරු ඔය ආශ්‍රිතව මේ වන විට කපා ඇති කුඹුක් ගස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කුඹුක් ගස් විනාශය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ජාවාරම්කරුවන් කවුරුන්ද:

(iii) අත්අඩංගුවට පත් එම ජාවාරම්කරුවන් ඉහත අ(iii) හි පරිදි නිදහස් කර යැවීමට උපදෙස් ලබාදුන් අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3094/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1996-2006 කාල පරිච්ඡේදය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිදුවූ වංචාවක් වැළැක්වීමට කටයුතු නොකිරීමෙන් විගණන පරීක්ෂක ජයවර්ධන නැමැත්තා විසින් වංචනික ක්‍රියාවක් සිදුකර තිබේද යන්න පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙසට පොලිස් දෙපාර්තමේන්තුවේ කොළඹ වංචා විමර්ශණ ඒකකයට දන්වා තිබේද;

(ii) ඉහත සඳහන් විගණන පරීක්ෂකවරයා අල්ලස් ලබා ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වෙත දන්වා තිබේද;

(iii) එම නිලධාරියාට රැකියාවක් සඳහා විදේශගතවීමට වැටුප් රහිත නිවාඩු අනුමත කර දී තිබේද;

(iv) විධිමත් කමිටුවක් මගින් පැවැත්වූ මූලික විමර්ශණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකොට, ඉහත පරිදි ඔහුට නිවාඩු අනුමත කිරීම නීති විරෝධි බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 පෙබරවාරි මස 22 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1941/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙණියාය මැතිවරණ බල ප්‍රදේශයේ පිහිටි අලපලාදෙණිය ප්‍රාදේශීය තේ ව්‍යාප්ති මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිලි සහ තේ වගා කරන ලද භූමිය භාවිතයට නොගෙන අත්හැර දැමීම හේතුවෙන් වල්බිහි වෙමින් පවතින බවත්;

(ii) මෙම මධ්‍යස්ථානය ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා තිබීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අලපලාදෙණිය ප්‍රාදේශීය තේ ව්‍යාප්ති මධ්‍යස්ථානය අතහැර දැමීමට හේතු කවරේද;

(ii) එම මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කර ඒ තුළින් ප්‍රදේශයේ තේ වගාකරුවන්ගේ ක්ෂේත්‍ර ගැටලු සඳහා උපදෙස් සලසාදීමට කටයුතු කරන්නේද;

(iii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2187/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරට අක්‍රියව පවතින රාජ්‍ය ව්‍යවසායන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යවසායන්හි නම් කවරේද;

(iii) එකී ආයතනයන්හි දැනට සේවයේ නියුතු සමස්ත සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන මේ වන විට ලබා ඇති සමස්ත අලාභය කොපමණද;

(v) එකී ආයතනයන්හි පවතින ගැටලු විසඳීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අක්‍රියව පවතින රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීමට හෝ වසාදැමීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, මේ අවස්ථාවේදී එම ආයතන සඳහා යළි ප්‍රාග්ධනය සැපයීමක් සිදු කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2368/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාව මඟින් පාසල් දරුවන්ට දිවා ආහාරය සඳහා බත් වේලක් නොමිලයේ ලබා දෙන බවට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි සෑම පාසල් දරුවෙකුටම දිවා ආහාරය හිමි වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මේ වන විට දිවා ආහාරය සඳහා බත් වේලක් ලබා දෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) දිවා ආහාර ලබා දීම සඳහා එම පාසල් තෝරා ගත් පදනම කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2415/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ශ්‍රී ලංකා සංවර්ධන සේවය" යනුවෙන් රජයේ රැකියා ලබාදීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ යටතේ බඳවා ගන්නා අයදුම්කරුවන්ගේ අවම සුදුසුකම් කවරේද;

(iii) ඔවුන්ට ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරු ලබා දෙන්නේද;

(iv) එම බඳවා ගැනීම සිදු කරන ක්‍රියා පිළිවෙත කවරේද;

(v) බඳවාගනු ලබන අයට ලබාදෙන මූලික වැටුප සහ අනෙකුත් දීමනා කවරේද;

(vi) ඔවුන්ට පැවරී ඇති කාර්ය භාරයන් කවරේද;

(vii) ඒ යටතේ බඳවා ගනු ලබන සංඛ්‍යාව කොපමණද;

(viii) රාජ්‍ය අංශයේ පුරප්පාඩු ඉතා විශාල ප්‍රමාණයක් තිබිය දී එම පුරප්පාඩු සම්පූර්ණ නොකර මෙම සේවය සඳහා බඳවා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3041/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බී.සී.සී සමාගමට අයත්, කොළඹ 10, සංඝරාජ මාවතේ පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට පවරාගත් දිනය කවරේද;

(ii) එම ඉඩම පවරාගැනීම යටත්වූ වැඩපිළිවෙළ කවරේද;

(iii) මෙම ඉඩමේ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉඩමේ වත්මන් වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පවරාගත් ඉහත සඳහන් භූමිය තුළ නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදුකිරීමට අපේක්ෂිත ඉදිකිරීම් කටයුත්ත කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3102/'12

ගරු පී. හැරිසන් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 වර්ෂය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවැලි ප්‍රදේශවල නියඟයෙන් වගා හානියට පත්වූ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම වගා ඉඩම් හිමියන් අතරින් වන්දි ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(iii) වන්දි ලෙස ඔවුන්ට ලබාදුන් මුලු මුදල කොපමණද;

(iv) හානි වූ කුඹුරු ඉඩම් වෙනුවෙන් කොට්ඨාස මට්ටමින්, වෙන් වෙන් වශයෙන් බිත්තර වී ලබා දුන් කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ ලබා දුන් බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(v) වගා හානි වෙනුවෙන් ට්‍රැක්ටර් කුලී සහනය ලෙස අක්කරයක් වෙනුවෙන් ලබාදුන් මුදල කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවැලි එච් කලාපයේ ඇති ගොවි සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොවි සංවිධාන අතරින් මේ වන විට රුපියල් ලක්ෂය බැගින් ලබා දී ඇති ගොවි සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ මුදල් නොලැබූ ගොවි සංවිධානවලට ඉදිරියේදී එම මුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහවැලි ප්‍රදේශවල ළිං පිළිසකර කිරීම සඳහා 2012 වර්ෂය තුළදී දුන් මුළු මුදල කොපමණද;

(ii) එක් ළිඳක් වෙනුවෙන් වෙන් කළ මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1961/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඟුණුකොළපැලැස්ස දිසා රෝහලෙහි පවත්නා දැඩි භෞතික හා මානව සම්පත් හිඟය හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව විශාල ගැටළු රැසකට මුහුණපා ඇති බවත්;

(ii) මෙහි ගොඩනැගිලි කිහිපයක් ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් අත්හැර දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අඟුණුකොළපැලැස්ස දිසා රෝහලට අවශ්‍ය පහසුකම් කඩිනමින් ලබාදීම සඳහා සැලසුම් කර තිබේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, රෝහලේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම රෝහලේ පවතින සේවක ඌනතාව කොපමණද යන්න හඳුනාගෙන තිබේද;

(ii) ඒ අනුව එක් එක් අංශ සඳහා පවත්නා සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2370/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ , "සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය" යළි ක්‍රියාවට නංවන බවට පොරොන්දුවක් ලබා දී ඇති බව දන්නේද;

(ii) ඉහත පොරොන්දුව ලබා දී වර්ෂ කිහිපයක් ගත වී ඇතත් මෙතෙක් එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පමා වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වැඩිපුරම භාවිතා වන ඖෂධ වර්ග දේශීයව නිෂ්පාදනය කිරීමට පියවර ගන්නා බවට වූ මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා ප්‍රතිපත්ති මාලාවේ යෝජනාව පරිදි මේ වන විට දේශීයව නිපදවන ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධ වර්ග කවරේද;

(iii) දේශීයව ඖෂධ නිපදවීම සඳහා වර්ෂයකට වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2417/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012.02.11 දින හෝ ඊට ආසන්න දිනක සිදුකළ ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් අපහසුතාවට පත්ව ඇති අඩු ආදායම්ලාභී වතු කම්කරු ජනතාවට සහන සැලසීම සඳහා ගැනීමට නියමිත හෝ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම කම්කරු ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම සහනාධාර ලබාදෙන ක්‍රමවේදය කවරේද;

(iv) එම ඉන්ධන සහනාධාරය ලබා දීම ක්‍රියාත්මක කරන කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අඩු ආදායම්ලාභී වතු කම්කරු ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

(ii) ආර්ථිකමය වශයෙන් ඉතාමත් පහත් මට්ටමක සිටින, විදුලිය ලබා ගැනීම සිහිනයක්ම වී ඇති ඔවුන්ට ඉන්ධන සහන ලබා නොදීම බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2899/’12

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටි මාළු ටින් කිරීමේ කම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ආරම්භ කළ දිනයන් කවරේද;

(iii) මෙම කම්හල් ආරම්භ කිරීමට වසර 5කට පෙර මෙරටට ආනයනය කරන ලද ටින් මාළු ප්‍රමාණය කොපමණද;

(iv) මාළු ටින් කිරීමේ කම්හල් ආරම්භ කළ දින සිට මේ දක්වා ආනයනය කළ ටින් මාළු ප්‍රමාණයන් එක් එක් වර්ෂ සඳහා වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත කී ආනයනයන්හි වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(vi) දේශීය වශයෙන් ටින් මාළු කම්හල් ආරම්භ කිරීම හේතුවෙන් ඉතිරි වූ විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(vii) එලෙස මුදල් ඉතිරි වන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3103/’12

ගරු පී. හැරිසන් මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය තුළ ඇති;

(i) ජනතාව පදිංචි ඉඩම් කට්ටි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත ඉඩම් අතරින් සින්නක්කර ඉඩම් කට්ටි, බදු ඉඩම් කට්ටි හා අනවසර ඉඩම් කට්ටි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් බදු ඉඩම්ලාභීන්ට සින්නක්කර ඔප්පු ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම කටයුතු කඩිනම් කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය තුළ සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමක් සිදු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඔවුන්ගේ පදිංචිය එම ස්ථානවලම නීත්‍යානුකූල කරන්නේද;

(iii) එම අනවසර පදිංචිකරුවන්ගෙන් වරිපනම් හෝ වෙනත් බදු මුදලක් අය කරන්නේද;

(iv) විදුලිය හා වෙනත් පහසුකම් ලබාදීමේදී ඔවුන්ගේ අයිතිය සනාථ කිරීම සඳහා පරීක්ෂා කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1962/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වාර්තාවට අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රුපියල් මිලියන 6400 ක වංචාවක් සිදු වී ඇති බවත්;

(ii) ආනයනය කරන ලද වාහන බඳ කොටස් යොදා සකසන වාහන සඳහා දැනට ලියාපදිංචි කර ඇති වාහනවල අංක යෙදීම තුළින් මෙම වංචාව සිදු කරන බවත්;

(iii) එම නිසා රජයට විශාල ආදායමක් අහිමි වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම වංචාවට අදාළව විධිමත් පරීක්ෂණයක් පවත්වා වැරදිකරුවන්ට දැඩි දඬුවම් දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2371/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ තැලසීමියා රෝගය ව්‍යාප්තව පවතින දිස්ත්‍රික්ක කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2011 දක්වා වාර්තා වී ඇති තැලසීමියා රෝගීන් සංඛ්‍යාව හා මරණ සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට තැලසීමියා රෝගය ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්කවල වෙසෙන සමස්ත තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) වැඩිම තැලසීමියා රෝගීන් සංඛ්‍යාවක් සිටින සහ එම රෝගයෙන් වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තාවන දිස්ත්‍රික්කය කවරේද;

(v) එම මරණ සංඛ්‍යාව කොපමණද;

(vi) එම දිස්ත්‍රික්කයේ සිටින තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තැලසීමියා රෝගය සඳහා ස්ථිර ප්‍රතිකාර ක්‍රමයක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමය ලංකාවේ ක්‍රියාත්මක වන්නේද;

(iii) තැලසීමියා රෝගීන් සඳහා ලබා දෙන එන්නත් වර්ගය කුමක්ද;

(iv) එම එන්නත ආනයනය කරන රට කුමක්ද;

(v) එන්නත් ආනයනය සඳහා වාර්ෂිකව වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2488/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුරය ඔයාමඩුව ප්‍රදේශයේ 2012 වර්ෂයේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය යටතේ,

(i) සංවර්ධන කටයුතු දියත්කළ දිස්ත්‍රික්කවල ඇති බෞද්ධ විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රතිසංස්කරණය කරන ලද විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් විහාරස්ථානය වෙත ලබා දුන් මුදල හා සියලු විහාරස්ථාන වෙත ලබාදුන් සමස්ත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇතුළත් කර නොගත් විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(v) එම විහාරස්ථාන ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2900/'12

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉරාන ඛනිජ තෙල් සම්බාධක පනවන ලද දිනය කවරේද;

(ii) එම සම්බාධකයෙන් ශ්‍රී ලංකාවද බැඳී සිටින්නේද;

(iii) ඉරාන ඛනිජ තෙල් වාර්ෂික පරිභෝජනය සහ මේ වර්ෂයේදී සම්බාධකය පැනවීම තෙක් වාර්ෂික පදනමින් පසුගිය වර්ෂ තුනක කාලය තුළ ආනයනය කරන ලද ඉරාන බොර තෙල් ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉරාන ඛනිජ තෙල් ආනයන ආදේශකයක් ශ්‍රී ලංකාව විසින් යොදාගන්නේ කෙසේද;

(ii) ඉහත කී සම්බාධකය පැනවූ දින පටන් ආදේශනය සඳහා ඛනිජ තෙල් ආනයනය සිදු කරන ලද්දේ කුමන රටකින්ද;

(iii) යුරෝපීය රටවල් ඉරානයට වෙළඳ සම්බාධක පැනවීමෙන් පසුව ඉරානයෙන් සිදුකළ සීමිත ඛනිජ තෙල් ආනයන සඳහා ගෙවීමට සිදුවූ වැඩිකළ වාරිකයේ අමතර වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2013 පෙබරවාරි මස 22 වැනි සිකුරාදා)

1632/'11

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (7)

(අ) (i) 2001 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී, 1841 අයාල ආඥාපනත යටතේ අත්අඩංගුවට ගත් සහ රක්ෂිත බන්ධනාගාරගත කළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කොට සිටි අය අතුරින් තවමත් බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ස්ථානවල රඳවා සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයාල ආඥාපනතෙහි සඳහන් වන ''නිවැරදි කළ නොහැකි නොදැමුණු පුද්ගලයන්'' (Incorrigible Rogues) යන පදයෙහි අර්ථය කවරේද;

(ii) එම පදය භාවිතාකොට ඇත්තේ කවර අරමුණකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයාල ආඥාපනතට සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව 2004 වසරේදී මානව හිමිකම් කොමිසම ඉදිරියේ නිර්දේශ ඉදිරිපත් කරන ලද බව පිළිබඳව සහ ඒවා භාවිතා කරන ආකාරය එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා පියවර ගනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, එම ආඥාපනත යටතේ වන ව්‍යවහාරයන් සඳහා වන වෙනස් කිරීම් තහවුරු කිරීමට ගනු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2303/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 1990 සිට 2011 දක්වා කාල සීමාව තුළ ඩෙංගු වැළඳීම, රිය අනතුරු, සියදිවි නසා ගැනීම, ආහාර විෂවීම, කායික හෝ මානසික අතවරයන්ට ලක්වීම යන හේතු මත රෝහල්ගත කළ / මිය ගිය පාසල් ළමුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වර්ෂය තුළ විවිධ වරදවල් යටතේ චෝදනා ලබා ළමා අධිකරණයට යොමු කර ඇති පාසල් සිසුන් සංඛ්‍යාව, ඔවුන් අයත්වන වයස් කාණ්ඩය හා පාසල අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2416/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2006 වර්ෂයේ සිට මේ දක්වා දිවයින පුරා මාර්ග ඉදිකිරීම සහ සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබා දී ඇති ආයතන;

(ii) එම එක් එක් ආයතනයට කොන්ත්‍රාත් ලෙස ලබා දුන් මාර්ග;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් මාර්ගය සඳහා ඇස්තමේන්තු කළ මුදල සහ වැඩ අවසන් වන විට වැය කර ඇති මුදල;

(ii) කොන්ත්‍රාත් ලබාදීමෙන් පසු එම එක් එක් මාර්ගයේ වැඩ සඳහා ගෙවන ලද මුදල;

(iii) එක් එක් මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් මේ වන විට ගෙවීමට ඇති හිඟ මුදල;

(iv) එම මාර්ග ඉදිකළ කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීමට ඇති සමස්ත හිඟ මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වන විට වැඩ නිම කළ කොන්ත්‍රාත් සඳහා සම්පූර්ණ මුදල් ගෙවීම් සිදුකර නොමැති නම්, එයට හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2572/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් සභා ක්‍රමය ආරම්භ වූ දින සිට මේ දක්වා එක් එක් පළාත් සභාව තුළ වාර්තාවන කාන්තා නියෝජනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ක්‍රියාත්මක සියලු පළාත් සභාවල සිටින මන්ත්‍රීවරියන් සංඛ්‍යාව මුළු පළාත් සභා මන්ත්‍රීන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

(iii) පළාත් සභා තුළ දැනට පවතින කාන්තා නියෝජනය ප්‍රමාණවත් මට්ටමක තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2864/'12

ගරු එම්. ටී. හසන් අලි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ මහ නගර සභාවේ විශ්‍රාමික සහකාර වැද්දුම්කරු ඒ. එච්. එම්. මහ්රූෆ් මහතාගේ පැමිණිල්ලකට අදාලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කොළඹ මහ නගර සභාවට නිකුත් කළ නිර්දේශයක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව පළාත් පාලන කොමසාරිස් (බ.ප.) විසින් අංක LGD/09/01/10 හා 2012.02.29 දිනැති ලිපිය මගින් නාගරික කොමසාරිස් වෙතින් විමසා ඇති බවත්;

(ii) 2012.05.14 දින සහ 2012.05.31 දිනැති ලිපි මගින් තවදුරටත් ඒ පිළිබඳව සිහි කැඳවීම් කොට තිබෙන බවත්;

(iii) රා. ප. චක්‍රලේඛ අංක 17/2005 ට පටහැනිව ක්‍රියා කරන කොළඹ මහ නගරසභාවේ නිලධාරීන් ඉහත අ(i) හි සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මහ්රූෆ් මහතාට නිර්දේශිත සහන ලබා දීම ප්‍රමාද කිරීමට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2905/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු දිනයේ සිට අද දක්වා ශ්‍රී ලංකාව පාලනය කර ඇති රජයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i)හි සඳහන් කරන ලද එක් එක් රජයෙහි ආරම්භයේ සිට අවසානය දක්වා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1985, 1995, 2005 සහ 2012 යන වර්ෂයන්වලදී එක් අමාත්‍යවරයෙකු වෙනුවෙන් දරන ලද සාමාන්‍ය පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් සභා පනත මගින් පළාත් සභාවන්හි අමාත්‍යවරු සංඛ්‍යාව සීමාකර ඇති ආකාරයට, කැබිනට් අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව නීතියෙන් සීමා නොකිරීමට හේතුව කවරේද;

(ii) කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව වැඩි කිරීමෙන් රටට යහපතක් වී තිබේද; එසේ නැතහොත්, එමගින් රටට වැඩි බරක් පැටවී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3008/'12

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ, අංක R/1566/G/51 යටතේ ලියාපදිංචි, ගාල්ල, මිලිද්දුව, එච්. කේ. එඩ්මන්ඩ් මාවතේ, වරිපනම් අංක 113 දරන ස්ථානයේ පිහිටි මස්ජිද් මුහියිද්දීන් තෙක්කා දේවස්ථානයට අයත් (වකුෆ් දේපළ) නිවාස සහ කඩ කාමර, කුලී පදනම යටතේ හෝ අන් ආකාරයකට ඒවා පරිහරණය කරන අයවලුන් විසින් මුස්ලිම් පල්ලි සහ පුන්‍යායතන දේපළ පනතේ අදාළ ගැසට් නියෝග අනුව අදාළ නීත්‍යානුකූල බදු ගිවිසුම් අත්සන් කරන ලද දින කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම වකුෆ් දේපළවල පදිංචිකරුවන් සහ ඒවා පරිහරණය කරන්නන් අදාළ ගැසට් නියෝගයේ සඳහන් විධිවිධානයන්ට යටත්ව වර්තමාන වටිනාකම් තක්සේරු අනුව හිඟ වාරික ඇතුළුව බදු මුදල් නොගෙවා එම දේපළ පෞද්ගලික සන්තකයන් බවට පත්කර ගැනීමට උත්සාහ කරන හෙයින් ඔවුන් එම දේපළවලින් ඉවත් කිරීමට පියවර ගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2573/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන පළාත් පාලන ආයතන ආරම්භ වූ දින සිට මේ දක්වා එම එක් එක් ආයතනය නියෝජනය කළ කාන්තා නියෝජිතයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කාන්තා පළාත් පාලන නියෝජිතයින්ගේ සංඛ්‍යාව සියලු පළාත් පාලන නියෝජිතයින්ගේ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) පොදු ජනතාවට සමීපතම මහජන නියෝජන ක්ෂේත්‍රය වන පළාත් පාලන ආයතන තුළ සෑහීමකට පත්විය හැකි කාන්තා නියෝජනයක් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2866/'12

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කහටගහමඩ, සියඹලාගස්කොටුවේ පදිංචි එස්. එච්. එම්. පාතිමා මහත්මිය ගිරි/දලුපොතගම කණිෂ්ඨ විද්‍යාලයේ 2002.02.01 දින සිට ස්වේච්ඡා ගුරුවරියෙකු වශයෙන් සේවය කරමින් සිටින බවත්;

(ii) ඒ අනුව ගුරු සහායක පත්වීමක් ලැබීමට හිමිකම් ලද පාතිමා මහත්මියට වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා අධ්‍යාපන අමාත්‍ය ලේකම් විසින් ව/ප්‍රඅලේ/ආ13/3/4 හා 2009.08.17 දිනැති ලිපිය මගින් එම පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට යොමු අංක 11 යටතේ කැඳවීම් කරනු ලැබුවත්, එම ගුරු සහායක පත්වීම මෙතෙක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වර්ෂ 2009 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි පාතිමා මහත්මියට හිමි ගුරු සහායක පත්වීම ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2579/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ යුද්ධය නිසා විනාශ වූ මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) විනාශ වූ නිවාස සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම නිවාස නැවත ඉදිකිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iv) එක් නිවසක් ඉදිකිරීම සඳහා රජයේ අනුග්‍රහය මත ලබා දෙන සහනවල වටිනාකම කොපමණද;

(v) උතුරු පළාතේ විනාශ වී ඇති සියලු නිවාස ඉදිකර අවසන් කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?